වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

Annual Report

2014

වී අලෙවි මණ්ඩලය

நெல் சந்தைப்படுத்தல் சபை

PADDY MARKETING BOARD

වී අලෙවි මණ්ඩලය
நெல் சந்தைப்படுத்தல் சபை
PADDY MARKETING BOARD

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT
2014

1971 අංක 14 දරණ වී අලෙවි මණ්ඩල පනතේ, 31(1) වගන්තිය ප්‍රකාර 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ස්වකීය බලතල, වගකීම්, කාර්යභාරයන්, ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම සම්බන්ධයෙන් ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තාවයි.

වී අලෙවි මණ්ඩලය
වාර්ෂික වාර්තාව - 2014

	පිටුව
❖ වී අලෙවි මණ්ඩලයේ දැක්ම, මෙහෙවර, පරමාර්ථ හා කාර්යභාරය	1
❖ 2014 වර්ෂයේ වී අලෙවි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය	2
❖ 2014 වර්ෂයේ වී අලෙවි මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය	3
❖ සභාපතිවරයාගේ සමාලෝචනය	4
❖ වී අලෙවි මණ්ඩලයේ සංවිධාන ව්‍යුහය	7
❖ වී අලෙවි මණ්ඩලයේ කලාපවල ව්‍යාප්තිය	8
❖ වී මිලදී ගැනීමේ වැඩසටහන	10
❖ 2014 වර්ෂයේ වී අලෙවි මණ්ඩලය මඟින් සිදු කරන ලද වී විකුණුම් පිළිබඳ විස්තර	13
❖ මූල්‍ය විශේෂතා (2009 -2014)	14
❖ වී අලෙවි මණ්ඩලය මගින් වී මිලදී ගැනීම සඳහා ලබා ගත් ණය සහ පොලී මුදල් පිළිබඳ විස්තර - (2008 - 2014)	15
❖ වී සඳහා වන සහතික මිල (2000 - 2014)	16
❖ වී අලෙවි මණ්ඩලය සතු ගබඩා	17
❖ 2014 වර්ෂයේ වී අලෙවි මණ්ඩලය මඟින් සිදු කරන ලද අළුත්වැඩියා කිරීම් පිළිබඳ විස්තර	25
❖ 2014 වර්ෂයේ වී අලෙවි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය	26
❖ අභ්‍යන්තර විගණනය	27
❖ 2014 වර්ෂයේ වී අලෙවි මණ්ඩලයේ වාර්ෂික ගිණුම්	29
❖ විගණකාධිපති වාර්තාව - 2014	55

දැක්ම

වී සහ සහල් මිලට ගැනීම, ගබඩා කිරීම, සැකසීම හා අලෙවි කිරීම පිළිබඳ ප්‍රමුඛ රාජ්‍ය මැදිහත්කරු වශයෙන් කටයුතු කිරීම.

මෙහෙවර

නිෂ්පාදකයා හා පාරිභෝගිකයා යන දෙපාර්ශ්වයම තෘප්තිමත් වන අයුරින් වී සහ සහල් මිලට ගැනීමේ, ගබඩා කිරීමේ, සැකසීමේ හා අලෙවි කිරීමේ ක්‍රියාවලිය දැනුමෙන් හා කුසලතාවයෙන් පරිපූර්ණ වූ කාර්ය මණ්ඩලයක් තුළින් සාර්ථකව ඉටු කිරීම.

පරමාර්ථ

ඉහත මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලය ප්‍රධාන පරමාර්ථ තුනක් ඉටුකර ගැනීමේ අභිලාශයෙන් ක්‍රියාත්මක වේ.

- වී සඳහා වෙළඳපොළෙහි ස්ථාවර ඉහළ මිලක් පවත්වාගෙන යාම.
- සාධාරණ මිලකට සහල් ලබා දීම.
- රටේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම.

වී අලෙවි මණ්ඩලයේ අරමුණු

1. වී සහ සහල් මිලදී ගැනීමේ අලෙවි කිරීමේ සැපයීමේ සහ බෙදා හැරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

2. වී සහ සහල් කෙටීමේ, පැහීමේ සහ සකස් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.

3. (1) සහ (2) ඡේදයන්හී සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආනුෂාංගික වන හෝ ඉවහල් විය හැකි වෙනත් යම් ව්‍යාපාරික කටයුත්තක් පවත්වාගෙන යාම සහ

4. මණ්ඩලයේ අදහස් කරන පරිදි ව්‍යාපාරික කටයුතු නියමිත ආකාරයෙන් පවත්වා ගෙන යාමට අවශ්‍ය යැයි හැඟෙන සියලුම කාර්යයන් ඉෂ්ඨ සිද්ධ කිරීම.

2. 2014 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලය

2014 වර්ෂයේ වී අලෙවි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත නම් සඳහන් සාමාජික මහත්ම මහත්මීන්ගෙන් සමන්විත විය.

1. කේ. බී. ජයසිංහ මහතා	-	සභාපති, වී අලෙවි මණ්ඩලය
2. නිමල්කා ඩයස් මහත්මිය	-	ආහාර කොමසාරිස්, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව
3. ඩබ්.එච්. කරුණාරත්න මහතා (2014.06.18 දක්වා) උපුල් ශාන්ත ද අල්විස් මහතා (2014.08.19 සිට)	-	සමූපකාර සංවර්ධන කොමසාරිස්, සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
4. එම්.ඒ. සුනිල් වීරසිංහ මහතා	-	ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන කොමසාරිස් දෙපාර්තමේන්තුව.
5. එම්.ටී.අයි.වී. අමරසේකර මහත්මිය	-	අධ්‍යක්ෂිකා, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව.
6. අනිල් කුමාර සේනාධිර මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
7. ඒ.ආර්.එම්. හාරිස් මහතා	-	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

2014 වර්ෂය තුළ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම් 09ක් පවත්වන ලදි. 2014 වර්ෂයේද අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ලෙස නීති නිලධාරි රුවන්තිකා ගුණවර්ධන මහත්මිය කටයුතු කරන ලදි.

3. 2014 වර්ෂයේ වී අලෙවි මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

1. එස්.එම්. සමන් පාලිත බණ්ඩාර මහතා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මෙහෙයුම්)
2. කේ.ඒ.වී.යූ.එස්. පෙරේරා මහතා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මෙහෙයුම්)
3. ආර්.සී. රත්නායක මහතා	-	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්)
4. එම්.කේ.ඩබ්.එස්. ද සිල්වා මහතා	-	ගණකාධිකාරි
5. ආර්.එම්. රුවන්තිකා ගුණවර්ධන මිය	-	නීති නිලධාරි
6. ඒ.එම්.යූ.එන්. අතපත්තු මහතා (2014.07.01 සිට)	-	අභ්‍යන්තර විගණක
7. නිමල් ඒකනායක මහතා	-	ප්‍රාදේශීය කළමනාකරු, වයඹ
8. ආර්.එම්.ඒ. රත්නායක මහතා	-	ප්‍රාදේශීය කළමනාකරු, අනුරාධපුරය
9. සුරංග සේනානායක මහතා	-	ප්‍රාදේශීය කළමනාකරු, අම්පාර
10. එන්.ජී.සී.කේ. නිශ්ශංක මහතා	-	ප්‍රාදේශිය කළමණාකරු, පොළොන්නරුව
11. රණවක වීරසේකර මහතා	-	ප්‍රාදේශීය කළමනාකරු, නැගෙනහිර
12. අජිත් ශාන්ත කුමාර මහතා	-	ප්‍රාදේශීය කළමනාකරු, උතුර
13. ඩී.එස්. දිසානායක මහතා	-	ප්‍රාදේශීය කළමනාකරු, දකුණ

4. සභාපතිවරයාගේ සමාලෝචනය

1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනත යටතේ ස්ථාපිත වී අලෙවි මණ්ඩලයේ ප්‍රධාන අරමුණ වන්නේ,

1. වී සඳහා වෙළඳපොළෙහි ස්ථාවර ඉහළ මිලක් පවත්වාගෙන යාම.
2. සාධාරණ මිලකට සහල් ලබා ගැනීමට අවස්ථාව සැලසීම.
3. රටේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම.

වී අලෙවි මණ්ඩලයේ ප්‍රධාන කාර්ය භාරය පහත සඳහන් පරිදි වේ.

1. වී සහ සහල් මිලදී ගැනීමේ අලෙවි කිරීමේ සැපයීමේ සහ බෙදා හැරීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යාම.
2. වී සහ සහල් කෙටීමේ, පැහීමේ සහ සකස් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම.
3. (1) සහ (2) ඡේදයන්හී සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආනුෂාංගික වන හෝ ඉවහල් විය හැකි වෙනත් යම් ව්‍යාපාරික කටයුත්තක් පවත්වාගෙන යාම සහ
4. මණ්ඩලයේ අදහස් කරන පරිදි ව්‍යාපාරික කටයුතු නියමිත ආකාරයෙන් පවත්වාගෙන යාමට අවශ්‍ය යැයි හැඟෙන සියලුම කාර්යයන් ඉෂ්ඨ සිද්ධ කිරීම.

2007 ජූලි 15 වෙනි දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයකට අනුව නැවත ස්ථාපිත කරන ලද වී අලෙවි මණ්ඩලය වී මිලදී ගැනීමේ, ගබඩා කිරීමේ, අලෙවි කිරීමේ කාර්යය සඳහා සක්‍රිය ලෙස දායකත්වය සැපයීම නැවත ආරම්භ කරන ලදි. ඒ අනුව 2014 වර්ෂයේ වාර්ෂික වී නිෂ්පාදනය මෙ.ටො. 4,109,326 ක් වන අතර 2013/14 මහ කන්නයේ වී අලෙවි මණ්ඩලය විසින් මිලදී ගත් වී ප්‍රමාණය මෙ.ටො. 4,576 ක් විය. මේ සඳහා වැය කර ඇති මුදල දළ වශයෙන් රු.මි. 148.2 ක් පමණ වේ. මෙම වී තොග වලින් කොටසක් මුදලට විකිණීමට කටයුතු කර ඇති අතර තවත් කොටසක් ලෝක ආහාර සංවිධානයට හා සමූපකාර තොග වෙළඳ සංස්ථාවට ලබා දීමට කටයුතු කර ඇත. තවද, 2014 වර්ෂයේ වී අලෙවි මණ්ඩලය සතු වී තොග වලින් කොටසක් අපනයනය කිරීම සඳහා ද කටයුතු කොට ඇත. ඉතිරි වී තොග ආරක්ෂිත තොගයක් වශයෙන් තබා ගැනීමට කටයුතු කරන ලදි.

මෙම වර්ෂය තුළදි වී මිලදී ගැනීමේ හා අලෙවි කිරීමේ කාර්යයට මැදිහත් වීම මගින් විවෘත වෙළඳපොළේ වී මිල ස්ථාවර තත්ත්වයකින් පවත්වාගෙන යාමටත් පාරිභෝගිකයා සඳහා සාධාරණ මිලකට සහල් තොග සැපයීමට දායකත්වය සැපයීමට වී අලෙවි මණ්ඩලයට හැකි වී ඇත.

වී අලෙවි මණ්ඩලය සතු ගබඩා 213 ක් පමණ වී ගබඩා කිරීමේ කාර්යය සඳහා යොදවා ගෙන ඇති අතර මෙම වර්ෂය තුළ වී ගබඩා 11 ක් අලුත් වැඩියා කිරීමටත් කලාප කාර්යාල වන පෙළොන්නරුව හා හම්බන්තොට යන කාර්යාල අලුත් වැඩියා කිරීමටත් කටයුතු කර ඇත.

ලංකා බැංකුවෙන්, මහජන බැංකුවෙන්, ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන් ලබා ගත් ණය මුදල් වලින් මිලියන 1,882.3 ක් පමණ ආපසු ගෙවීමට 2014 වර්ෂය තුළදි කටයුතු කර ඇත. ඉතිරි වී තොග ආරක්ෂිත තොගයක් වශයෙන් තබා ගැනීමට කටයුතු කරන ලදි.

තවද, බිඳ වැටී තිබූ කුඩා හා මධ්‍ය පරිමාණයේ වී මෝල් රාශියක් යථා තත්ත්වයට පත් කරනු ලැබුවේ ද වී අලෙවි මණ්ඩලයේ මැදිහත් වීමෙන් සහල් සකස් කිරීම සඳහා වී ලබා දීම මගිනි.

තවද, මෙම වර්ෂය තුළ වෙනත් ආයතන සතුව තිබූ රජයේ සම්පතක් ලෙස සැලකෙන වී අලෙවි මණ්ඩලය සතු ගබඩා නැවත ආපසු ලබා ගෙන ගොවීන්ට මෙන් ම පාරිභෝගික ජනතාවට මහඟු මෙහෙවරක් කිරීමට මෙම වර්ෂය තුළ හැකි විය.

ආරම්භක අවස්ථාවේ දි වී අලෙවි මණ්ඩලයේ නියෝජිතයන් ලෙස කටයුතු කිරීම සඳහා සමූපකාර ප්‍රාදේශික ඇති කරන ලදි. එහෙත් ක්‍රමයෙන් සමූපකාර ප්‍රාදේශිකවලට අමතරව පුද්ගලික නියෝජිතයන් සහ ගොවිජන සේවා කමිටු වී අලෙවි මණ්ඩලයේ ගැනුම් නියෝජිතයන් ලෙස පත් කෙරුණි. නියෝජිත ක්‍රමයේ තිබූ යම් යම් අඩුපාඩු මඟ හරවා ගොවි ජනතාවට වඩාත් සමීපව ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කිරීමේ පහසුව සඳහා වී අලෙවි මණ්ඩලය විසින් ඍජුවම ගොවි ජනතාවගෙන් වී මිලදී ගැනීමට කටයුතු කරන ලදි. ඒ අනුව අදාළ ප්‍රදේශවල කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර (කෘ.ප.නි.ස) විසින් සහතික කරන ලද තොරතුරු වාර්තාව සමග ගොවින් විසින් ඍජුවම ගබඩාවට වී ලබා දෙයි. 2014 වර්ෂයේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර විසින් ගොවියෙකු වෙනුවෙන් නිර්දේශ කර ඇති වී ප්‍රමාණය කි.ග්‍රෑ. 2,000 ක් වූ උපරිම ප්‍රමාණයක් වේ.

2014 වර්ෂයේදි වී මිලදි ගැනීමට භාවිතා කරන ලද ප්‍රමිතීන් පහත පරිදි වේ.

1. තෙතමනය (උපරිම) - 14%
2. අපද්‍රව්‍ය (උපරිම) - 1%
3. වර්ග මිශ්‍රණය (උපරිම) - 6%
4. බොල් වී ප්‍රමාණය (පරිමාව අනුව උපරිම) - 9%
5. දුර්වර්ණ ඇටවලින් තොරවිය යුතුය.
6. ගල්වැලි අපද්‍රව්‍ය වලින් තොරවිය යුතුය.
7. කෘමීන්ගෙන් හානි වූ හා කෘමි බිත්තර හා වෙනත් හානි අවස්ථා වලින් තොර විය යුතුය.
8. දිලීර හානියට ලක් වූ ඇට වලින් තොර විය යුතුය.

2014 වර්ෂයේදි සහතික මිල අනුව මෙසේ නිසි ප්‍රමිතියට අනුව පිළියෙළ කරන ලද සම්බා සහ නාඩු වී අලෙවි මණ්ඩලය විසින් මිලදි ගන්නා ලදි. වී අලෙවි මණ්ඩලයට වී ලැබීම අඩු වූවත් වී වෙනුවෙන් ගොවි ජනතාවට හොඳ මිලක් ලබා දීමට හැකි විය.

ආසන්න වසර 06 තුළ වී අලෙවි මණ්ඩලය විසින් මිලදී ගත් වී තොග ප්‍රමාණයන් පහත පරිදි වේ.

කන්නය	මිලදී ගත් වී ප්‍රමාණය (මෙ.ටො.)					
	2009	2010	2011	2012	2013	2014
මහ	38,000	70,771	3,470	115,786	138,650	4,576
යල	13,374	111,756	75,172	10,476	94,376	-



බාධක හා අභියෝග

වී වේලා ගැනීම සඳහාත් වී ප්‍රවාහනය කිරීම සඳහාත් ගොවීන්ට පහසුකම් නොතිබීම, මෝල්හිමියන්ගෙන් ලබා ගත් ණය පියවීම සඳහා වී තොග අඩු මිලට ඔවුන් වෙත අලෙවි කිරීමට සිදු වීම, ඇතැම් ගබඩා නිසි ප්‍රමිතියෙන් යුක්ත නොවීම, පුහුණු නිළධාරින්ගේ හිඟය, මෙම වර්ෂය තුළ වී අලෙවි මණ්ඩලයට මුහුණ දීමට සිදු වූ අභියෝග ලෙස හඳුන්වා දිය හැකිය.

අනාගත සැලසුම් සකස් කිරීමේදී ගොවි සංවිධාන වල හා මෝල් හිමියන් සමඟ සාකච්ඡාකර ඔවුන්ගේ අදහස් ද ලබා ගනිමින් එකී සැලසුම් සකස් කිරීමට වී අලෙවි මණ්ඩලය විසින් දැනට පියවර ගෙන ඇත.

වී අලෙවි මණ්ඩලය හුදු වාණිජමය ආයතනයක් ලෙස ලාභය උපරිම කර ගැනීමේ අරමුණින් ම කටයුතු නොකෙරෙන අතර, වී ගොවීන් ආරක්ෂා කරමින් ඔවුන් වී සඳහා ස්ථාවර ඉහළ මිලක් පවත්වා ගැනීම, ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම හා පාරිභොගිකයන් සඳහා සහනදායි මිලක් ස්ථාපිත කිරීම යන අරමුණුවලට මුල්තැන දී ක්‍රියාත්මක වේ. කෙසේ වුවද, ගබඩා නවීකරණය කොට ගබඩාකරණය විධිමත් කරමින් වී තොග පිළිබඳ සියලු තොරතුරු පරිගණක ජාල ගත කර යාවත්කාලීන දත්ත පද්ධතියක් පවත්වා ගනිමින්, රජයට අවම පිරිවැයක් දැරීමට හැකිවන පරිදි සැලසුම්ගත ව්‍යාපාර සැලැස්මකට අනුව ඉතිරි වී තොග බැහැර කිරීමේ ක්‍රම වේදයක් වෙත මණ්ඩලයේ අවධානය යොමු වී ඇත.

සභාපති
වී අලෙවි මණ්ඩලය

5. 2014 වර්ෂයේ සංවිධාන ව්‍යුහය



6. වී අලෙවි මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලවල ව්‍යාප්තිය



- **ප්‍රාදේශීය කාර්යාලවල ලිපිනයන්**

01. ප්‍රාදේශීය කළමනාකරු,
වී අලෙවි මණ්ඩලය
උතුරු කලාප කාර්යාලය,
කරඳපොක්කු හන්දිය,
කිලිනොච්චිය.

02. ප්‍රාදේශීය කළමනාකරු,
වී අලෙවි මණ්ඩලය,
පොළොන්නරු කලාප කාර්යාලය,
කඳුරුවෙල,
පොළොන්නරුව.

03. ප්‍රාදේශීය කළමනාකරු,
වී අලෙවි මණ්ඩලය,
අනුරාධපුර කලාප කාර්යාලය,
පුරහල පෙදෙස,
2 වන පටුමඟ,
අනුරාධපුර.

04. ප්‍රාදේශීය කළමනාකරු,
වී අලෙවි මණ්ඩලය,
වයඹ කලාප කාර්යාලය,
මිල්ලේගොඩ,
නිකවැරටිය.

05. ප්‍රාදේශීය කළමනාකරු,
වී අලෙවි මණ්ඩලය,
නැගෙනහිර කලාප කාර්යාලය,
දිස්ත්‍රික් මහලේකම් කාර්යාල පරිශ්‍රය,
ත්‍රිකුණාමලය.

06. ප්‍රාදේශීය කළමනාකරු,
වී අලෙවි මණ්ඩලය,
අම්පාර කලාප කාර්යාලය,
ඉගිණියාගල පාර,
අම්පාර.

07. ප්‍රාදේශීය කළමනාකරු,
වී අලෙවි මණ්ඩලය,
දකුණු කලාප කාර්යාලය,
දෙහිගහලන්ද,
අම්බලන්තොට.

7. වී මිලදී ගැනීමේ වැඩසටහන

- වී මිලදී ගැනීමේ ක්‍රම වේදය



වී මිලදී ගැනීමේ ප්‍රගතිය

- 2013/14 මහ කන්නයේ කලාප අනුව වී මිලදී ගැනීමේ ප්‍රගතිය

කලාපය	නාඩු (කි.ග්‍රෑ.)	සම්බා (කි.ග්‍රෑ.)	එකතුව	
			ප්‍රමාණය (කි.ග්‍රෑ.)	වටිනාකම (රු.)
අනුරාධපුරය	1,000	-	1,000	32,000.00
අම්පාර	3,005,586	385,100	3,390,686	109,657,252.00
නැගෙනහිර	67,900	1,250	69,150	2,216,550.00
වයඹ	399,800	172,850	572,850	18,843,350.00
දකුණ	499,658	28,011	527,669	16,969,441.00
උතුර	-	15,337	15,337	536,795.00
එකතුව	**3,973,944**	**602,548**	**4,576,492**	**148,255,388.00**



- වී තොග තත්ත්වය - 2014.12.31 දිනට

විස්තරය	සම්බා (කි.ග්‍රෑ.)	නාඩු (කි.ග්‍රෑ.)	එකතුව (කි.ග්‍රෑ.)
ආරම්භක තොගය 2014.01.01 දිනට	25,767,786	93,579,192	119,346,978
මිලදී ගැනීම් (2013/14) මහ කන්නය)	602,548	3,973,944	4,576,492
එකතුව	**26,370,334**	**97,553,136**	**123,923,470**
නිකුත් කිරීම්			
(a) සමූපකාර තොග වෙළඳ සංස්ථාව	5,039,430	32,592,609	37,632,039
(b) අපනයනය කිරීම්	-	2,531,000	2,531,000
(c) මුදලට වී විකිණීම	1,553,216	4,590,625	6,143,841
(d) ලෝක ආහාර වැඩසටහනට වී ලබා දීම	539,616	4,957,113	5,496,729
නිකුත් කිරීම් එකතුව	**7,132,262**	**44,671,347**	**51,803,609**
අවසන් තොගය - 2014.12.31 දිනට	19,238,072	52,881,789	72,119,861

8. වී අලෙවි මණ්ඩලය මගින් සිදු කරන ලද වී තොග විකුණුම් පිළිබඳ තොරතුරු

අනු. අංකය	විස්තරය	2013 වර්ෂයේ වී විකුණුම් ප්‍රමාණය (මෙ.ටො.)	2014 වර්ෂයේ වී විකුණුම් ප්‍රමාණය (මෙ.ටො.)	එකතුව (මෙ.ටො.)
01	සමුපකාර තොග වෙළඳ සංස්ථාවට වී නිකුත් කිරීම	143,479	37,632	181,111
02	අපනයනය කිරීම	-	2,531	2,531
03	මුදලට විකිණීම	107,011	6,144	113,155
04	ලෝක ආහාර වැඩසටහනට ලබාදීම	4,860	5,497	10,356
05	යුධ හමුදාව වෙත වී තොග නිකුත් කිරීම	2,564	-	2,564



9. මූල්‍ය විශේෂතා (2009-2014)

(රු. මි.)

විස්තර	2009	2010	2011	2012	2013	2014
ආදායම	1,705.38	138.95	3,500.20	3,617.88	7,878.87	1,554.51
මිලදී ගැනුම් - වී තොග	1,460.20	5,172.00	2,278.20	3,636.89	7,755.26	148.66
දළ ලාභය/ (අලාභය)	263.85	20.81	249.64	(1,440.93)	(121.98)	(237.02)
පරිපාලනය, මූල්‍ය හා අනෙකුත් වියදම්	47.00	211.68	367.85	630.64	1,674.62	983.562
ශුද්ධ ලාභය/ (අලාභය)	150.72	(346.75)	264.13	(1,996.23)	(1,036.23)	(1,126.93)
වී මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන ලැබීම්						
මහා භාණ්ඩාගාරය	1,060.00	1,300.00	700.00	100.00	250.00	-
ලංකා බැංකුව	-	2,250.00	410.40	914.80	1,150.00	-
මහජන බැංකුව	-	1,500.00	106.30	311.80	1,296.00	-
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	-	1,000.00	-	725.90	584.20	-
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	-	400.00	-	250.00	398.90	-
ණය ගැතියෝ						
සමූපකාර තොග වෙළඳ සංස්ථාව	-	-	341.39	1,587.08	1,404.92	462.59
ආහාර දෙපාර්තමේන්තුව	-	-	611.99	470.95	440.55	425.95
ලංකා ස. තො. ස.	-	-	90.41	49.94	79.93	77.53
ණය හිමියෝ						
මහා භාණ්ඩාගාරය	310.00	1,300.00	1,900.00	2,000.00	2,250.00	2,250.00
ලංකා බැංකුව	-	2,250.00	2,185.20	3,100.00	4,115.89	3,129.78
මහජන බැංකුව	-	1,496.96	1,354.45	1,553.74	2,651.99	2,314.94
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	-	267.80	47.80	725.95	1,142.96	1,000.00
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	-	380.47	-	241.99	416.13	-
මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන						
ප්‍රාග්ධන වියදම් සඳහා	4.93	9.00	182.90	112.00	80.00	175.00
පුනරාවර්තන වියදම් සඳහා	8.00	24.00	25.00	35.35	40.00	66.50
ප්‍රාග්ධන වැය භාවිතය						
නව ඉදිකිරීම් සඳහා	-	-	126.70	85.50	48.00	63.00
ගබඩා අලුත්වැඩියා කිරීම් සඳහා	4.93	6.30	52.30	25.10	27.00	105.00
ස්ථාවර වත්කම් මිලදී ගැනීම් සඳහා	-	2.68	3.90	1.40	5.00	7.00

10. වී අලෙවි මණ්ඩලය මගින් වී මිලදී ගැනීම සඳහා ලබා ගත් ණය සහ පොලී මුදල් පිළිබඳ විස්තර - 2008 සිට 2014 දක්වා

වර්ෂය	බැංකුව	ආරම්භක ණය ශේෂය (රු.මි.)	අදාළ වර්ෂය තුළ ලබාගත් ණය (රු.මි.)	ණය මුදලින් පියවා ඇති මුදල (රු.මි.)	වර්ෂය අවසාන ණය ශේෂය (රු.මි.)
2008	මහා භාණ්ඩාගාරය	-	200.0	-	200.0
	එකතුව	-	**200.0**	-	**200.0**
2009	මහා භාණ්ඩාගාරය	200.0	1,060.0	950.0	310.0
	එකතුව	**200.0**	**1,060.0**	**950.0**	**310.0**
2010	මහා භාණ්ඩාගාරය	310.0	1,300.0	310.0	1,300.0
	ලංකා බැංකුව	-	2,250.0	-	2,250.0
	මහජන බැංකුව	-	1,500.0	3.0	1,497.0
	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	-	1,000.0	732.2	267.8
	ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	-	400.0	19.6	380.4
	එකතුව	**310.0**	**6,450.0**	**1,064.8**	**5,695.2**
2011	මහා භාණ්ඩාගාරය	1,300.0	700.0	100.0	1,900.0
	ලංකා බැංකුව	2,250.0	410.4	475.3	2,185.1
	මහජන බැංකුව	1,497.0	106.3	248.8	1,354.4
	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	267.8	-	220.0	47.8
	ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	380.4	-	380.4	-
	එකතුව	**5.695.2**	**1,216.7**	**1,424.5**	**5,487.4**
2012	මහා භාණ්ඩාගාරය	1,900.0	100.0	-	2,000.0
	ලංකා බැංකුව	2,185.1	914.8	-	3,099.9
	මහජන බැංකුව	1,354.4	311.8	112.5	1,553.7
	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	47.8	725.9	47.8	725.9
	ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	-	250.0	8.0	242.0
	එකතුව	**5,487.4**	**2,302.5**	**168.3**	**7,621.6**
2013	මහා භාණ්ඩාගාරය	2,000.0	250.0	-	2,250.0
	ලංකා බැංකුව	3,099.9	1,150.0	134.1	4,115.8
	මහජන බැංකුව	1,553.7	1,296.0	265.4	2,584.3
	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	725.9	584.2	167.0	1,143.0
	ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	242.0	398.9	224.8	416.1
	එකතුව	**7,621.6**	**3,679.1**	**791.3**	**10,509.3**
2014	මහා භාණ්ඩාගාරය	2,250.0	-	-	2,250.0
	ලංකා බැංකුව	4,115.8	-	986.1	3,129.7
	මහජන බැංකුව	2,584.3	-	337.1	2,247.2
	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	1,143.0	-	143.0	1,000.0
	ප්‍රාදේශීය සංවර්ධන බැංකුව	416.1	-	416.1	0.0
	එකතුව	**10,509.3**	-	**1,882.3**	**8,626.9**

11. වී සඳහා වන සහතික මිල (2000 - 2014)

කන්නය	කිලෝවක මිල (රු.)	
	සම්බා	නාඩු
2000/01 මහ	13.50	12.50
2001 යල	13.50	12.50
2001/02 මහ	14.50	13.50
2002 යල	14.50	13.50
2002/03 මහ	14.50	13.50
2003 යල	14.50	13.50
2003/04 මහ	15.50	14.50
2004 යල	15.50	14.50
2004/05 මහ	16.50	15.50
2005 යල	16.50	15.50
2005/06 මහ	16.50	15.50
2006 යල	17.50	16.50
2006/07 මහ	17.50	16.50
2007 යල	17.50	16.50
2007/08 මහ	22.00	20.00
2008 යල	30.00	28.00
2008/09 මහ	30.00	28.00
2009 යල	30.00	28.00
2009/10 මහ	30.00	28.00
2010 යල	30.00	28.00
2010/11 මහ	30.00	28.00
2011 යල	30.00	28.00
2011/12 මහ	30.00	28.00
2012 යල	30.00	28.00
2012/13 මහ	35.00	32.00
2013 යල	35.00	32.00
2013/14 මහ	35.00	32.00
2014 යල	35.00	32.00

12. වී අලෙවි මණ්ඩලය සතු ගබඩා

අනු. අංකය	ගබඩාව	ධාරිතාවය (මෙ.ටො.)
	අම්පාර කලාපය	
	අම්පාර දිස්ත්‍රික්කය	
01	මහඔය 1	1,040
02	මහඔය 2	1,040
03	ගොනාගොල්ල	1,040
04	ඉඟිණියාගල	600
05	කොහොඹාන 1,2	2,080
06	පාලම් කදවුර 1	1,040
07	පාලම් කදවුර 2	1,040
08	කෝමාරිය 1	1,040
09	කෝමාරිය 2	1,040
10	කුමාරිගම	1,040
11	තම්බට්ට	1,700
12	වීරගොඩ 1,2	2,080
13	අම්පාර 1	1,040
14	අම්පාර 2	1,040
15	දමන 1	1,040
16	දමන 2	1,040
17	සමන්තුරය 1,2	2,080
18	පොතුවිල් 1	1,040
19	පොතුවිල් 2	1,040
20	අඩ්ඩාලච්චේන	1,040
21	අක්කරේපත්තුව	2,000
22	නින්දවූර් 1	1,040
23	නින්දවූර් 2	1,040
24	නෙල්ලිකැලේ	1,800
25	සඳුන්පුර	1,200
26	Z 2	1,000
27	Z 3	2,000
	එකතුව	**34,220**

අනු. අංකය	ගබඩාව	ධාරිතාවය (මෙ.ටො.)
	මහනුවර දිස්ත්‍රික්කය	
28	පල්ලේවත්ත 1	2,000
29	පල්ලේවත්ත 2	1,000
30	පල්ලේවත්ත 3	1,000
31	පල්ලේවත්ත 4, 6	1,600
32	පල්ලේවත්ත 5	500
33	කොලොංගොඩ	1,040
34	හසලක	600
35	මොරයාය 1	1,040
36	මොරයාය 1	1,040
	එකතුව	**9,820**
	බදුල්ල දිස්ත්‍රික්කය	
37	මහියංගනය 1	1,040
38	මහියංගනය 2	1,040
39	මැදයාය 2	1,040
40	කරමැටිය 1	1,040
41	ගිරාඳුරුකෝට්ටේ 1	1,040
42	ගිරාඳුරුකෝට්ටේ 2	1,040
	එකතුව	**6,240**
	වයඹ කලාපය	
	පුත්තලම් දිස්ත්‍රික්කය	
43	රාජකදළුව	1,000
44	ආණමඩුව 1	1,000
45	ආණමඩුව 2	1,000
	එකතුව	**3,000**
	කුරුණෑගල දිස්ත්‍රික්කය	
46	නිකවැරටිය 1	300
47	නිකවැරටිය 2	800
48	නිකවැරටිය 3	1,500
49	නිකවැරටිය 5	1,000
50	නිකවැරටිය 6	300
51	මහව 2	1,000
52	මහව 3	1,000
53	මහව 4	300
54	තඹබෝව 1	1,000
55	තඹබෝව 2	1,000

අනු. අංකය	ගබඩාව	ධාරිතාවය (මෙ.ටො.)
56	ගල්ගමුව	1,000
57	මාඑළිය 1	1,000
58	මාඑළිය 2	1,000
59	මාඑළිය 3	1,000
60	වරාවැව 1	1,200
61	වරාවැව 2	800
62	ගලේවෙල 1	1,000
63	ගලේවෙල 2	1,000
	එකතුව	**16,200**
	දකුණු කලාපය	
	හම්බන්තොට දිස්ත්‍රික්කය	
64	වීරවිල 1	1,000
65	වීරවිල 2	1,000
66	පල්ලේමලල 1	1,000
67	පල්ලේමලල 2	600
68	සූරියවැව	1,000
69	වීරකැටිය	1,000
70	දෙහිගහලන්ද 1	1,000
71	දෙහිගහලන්ද 2	1,000
72	දෙහිගහලන්ද 3	1,000
73	අම්බලන්තොට 1	750
74	කච්චිගල්ආර 1	1,000
75	කච්චිගල්ආර 2	1,000
76	කච්චිගල්ආර 3	1,000
77	යෝධකණ්ඩිය	2,000
	එකතුව	**14,350**
	මොණරාගල දිස්ත්‍රික්කය	
78	මැදගම	1,000
79	මුතුකණ්ඩිය 1	1,000
80	මුතුකණ්ඩිය 2	500
81	ඇතිමලේ 1	1,000
82	ඇතිමලේ 2	300
83	දොඩම්වත්ත 1	1,000
84	දොඩම්වත්ත 2	1,000
85	වැල්ලවාය	1,500
86	අලුත්වැව	1,500
	එකතුව	**8,800**

අනු. අංකය	ගබඩාව	ධාරිතාවය (මෙ.ටො.)
	රත්නපුර දිස්ත්‍රික්කය	
87	කුට්ටිගල 1	1,000
88	කුට්ටිගල 2	1,000
89	කුට්ටිගල 3	1,000
90	ඇඹිලිපිටිය	500
91	කල්තොට	1,000
92	මොරකැටිය 1	1,000
93	මොරකැටිය 2	1,000
	එකතුව	**6,500**
	මාතර දිස්ත්‍රික්කය	
94	මැද්දවත්ත	1,750
	එකතුව	**1,750**
	පොළොන්නරුව කලාපය	
	පොළොන්නරුව දිස්ත්‍රික්කය	
95	වීරපුර 1	1,568
96	තල්පොත 1	1,358
97	තල්පොත 2	1,045
98	පන්සල්ගොඩැල්ල	2,000
99	හිඟුරක්ගොඩ 1	1,045
100	හිඟුරක්ගොඩ 2	1,045
101	හිඟුරක්ගොඩ 3	730
102	හිඟුරක්ගොඩ 4	1,045
103	හිඟුරක්ගොඩ 5	1,000
104	හිඟුරක්ගොඩ 6	1,000
105	හිඟුරක්ගොඩ 7	1,000
106	බකමූණ	1,045
107	කුසුම්පොකුණ	1,568
108	අරලගංවිල 9 කණුව	1,000
109	මනම්පිටිය 1	1,045
110	මනම්පිටිය 2	1,045
111	විජයපුර	1,045
112	විජයබාපුර	1,000
113	මැදිරිගිරිය	1,358

අනු. අංකය	ගබඩාව	ධාරිතාවය (මෙ.ටො.)
114	ජයන්තිපුර 1	1,045
115	ජයන්තිපුර 2	1,045
116	අභයපුර	1,000
117	දියබෙදුම	1,045
118	කදුරුවෙල 1	730
119	කදුරුවෙල 2	1,045
120	කදුරුවෙල 3	1,045
121	කදුරුවෙල 4	3,000
122	මඩුදමන	1,045
123	ZD 1	1,750
124	වැලිකන්ද 1	1,500
125	වැලිකන්ද 2	1,500
126	වැලිකන්ද 3	1,500
127	වැලිකන්ද 4	1,500
128	වැලිකන්ද 5	1,500
129	අඹගස්වැව	1,000
	එකතුව	**43,192**
	මාතලේ දිස්ත්‍රික්කය	
130	හඳුන්ගමුව	1,045
131	හෙට්ටිපොළ 1	1,000
132	හෙට්ටිපොළ 2	1,000
133	හෙට්ටිපොළ 3	1,000
	එකතුව	**4,045**
	අනුරාධපුර කලාපය	
	අනුරාධපුර දිස්ත්‍රික්කය	
134	තලාව 1	1,000
135	තලාව 2	1,100
136	තලාව 3	1,100
137	සේනානායක 2	1,000
138	සේනානායක 3	1,000
139	සේනානායක 5	2,000
140	සේනානායක 6	1,000
141	සේනානායක 7	1,000
142	සේනානායක 8	1,000

අනු. අංකය	ගබඩාව	ධාරිතාවය (මෙ.ටො.)
143	තඹුත්තේගම	1,500
144	රාජාංගනය	1,000
145	බුල්නෑව 1	1,000
146	බුල්නෑව 2	2,500
147	බුල්නෑව 3	800
148	නෑගම 1	1,000
149	කටියාව	1,000
150	කැකිරාව 1	1,000
151	කැකිරාව 2	1,000
152	කැකිරාව 3	1,000
153	ශ්‍රාවස්තිපුර 1	1,000
154	නොච්චියාගම 1	1,000
155	නොච්චියාගම 2	1,000
156	යකල්ල	2,000
157	කහටගස්දිගිලිය	1,000
158	රබාවැව	1,000
159	කැබතිගොල්ලෑව	700
160	මැදවච්චිය	2,000
161	පේමඩුව	1,000
162	වාහල්කඩ	400
163	හොරොව්පතාන ආමි	2,000
164	හොරොව්පතාන	1,000
165	හොරොව්පතාන ඩී 01	400
166	පදවිපරාක්‍රමපුර 1	1,000
167	පදවිපරාක්‍රමපුර 2	1,000
168	පදවිපරාක්‍රමපුර 3	1,000
169	පදවිපරාක්‍රමපුර 4	1,000
170	සේනපුර 1	1,000
171	සේනපුර 2	1,000
172	හලබෑව	1,500
173	පදවිය	1,000
174	කලාවැව	2,000
175	ගලෙන්බිදුණුවැව 1	1,000
	එකතුව	**48,000**

අනු. අංකය	ගබඩාව	ධාරිතාවය (මෙ.ටො.)
	මාතලේ දිස්ත්‍රික්කය	
176	පැල්වෙහෙර 1	1,000
177	පැල්වෙහෙර 2	1,000
178	කණ්ඩලම 1	1,000
179	කණ්ඩලම 2	775
	එකතුව	**3,775**
	උතුරු කලාපය	
	වව්නියා දිස්ත්‍රික්කය	
180	වැලිපොළ	2,000
181	මාමඩුව	1,000
182	වෙප්පකුලම්	3,000
183	පාර්ක්රෝඩ්	2,000
184	නෙදුන්කර්නි 1	1,000
	එකතුව	**9,000**
	මන්නාරම් දිස්ත්‍රික්කය	
185	අල්කඩිවේලි	3,000
	එකතුව	**3,000**
	කිලිනොච්චි දිස්ත්‍රික්කය	
186	රාමනාදම්පුරම්	1,500
187	කිලිනොච්චි ආර්ථික මධ්‍යස්ථානය	1,000
188	කිලිනොච්චි නගර	750
	එකතුව	**3,250**
	මුලතිව් දිස්ත්‍රික්කය	
189	මුල්ලලියාවේලි	800
190	මාන්කුලම්	400
191	තුණුක්කායි	200
192	තන්නිරිත්තු	600
	එකතුව	**2,000**
	නැගෙනහිර කලාපය	
	ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය	
193	කල්ලාරු 1	1,000
194	කල්ලාරු 2	1,000
195	කන්තලේ 2	1,000
196	කන්තලේ 3	1,000
197	කන්තලේ 4	1,000
198	ස්වර්ණජයන්තිපුර	250
199	පදවිශ්‍රීපුර	1,000
200	ගොමරන්කඩවල	1,000
201	ලව්ලේන් 1	2,000
202	ලව්ලේන් 2	2,000
203	ලව්ලේන් 3	300
204	ලව්ලේන් 4	400
205	ලව්ලේන් 5	600

අනු. අංකය	ගබඩාව	ධාරිතාවය (මෙ.ටො.)
206	ලව්ලේන් 6	600
207	ලව්ලේන් 8	600
208	තඹලගමුව	2,600
209	කිලිවෙට්ටි	500
210	පන්කුලම	250
211	මැදවච්චිය	250
212	සූරංගල්	600
	එකතුව	**17,950**
	කොළඹ දිස්ත්‍රික්කය	
213	මීතොටමුල්ල	5,000
		5,000
	මුළු එකතුව	**241,592**

13. 2014 වර්ෂයේ වී අලෙවි මණ්ඩලය විසින් ඉටු කරනු ලැබූ අලුත්වැඩියා කිරීම් පිළිබඳ විස්තර

අනු. අංකය	දිස්ත්‍රික්කය	ගබඩාව/ වෙනත්	ගබඩා ධාරිතාවය (මෙ.ටො)	ව්‍යාපෘතිය සඳහා දරා ඇති පිරිවැය (රු.මි)
01	අම්පාර	අක්කරේපත්තුව ගබඩාව	1,600	26.57
02	අනුරාධපුරය	මැදවච්චිය ගබඩාව	2,000	23.45
03	අනුරාධපුරය	රඹෑව ගබඩාව	1,000	11.16
04	පොළොන්නරුව	හිඟුරක්ගොඩ ගබඩාව	1,040	6.77
05	පොළොන්නරුව	කඳුරුවෙල ගබඩාව	2,000	22.73
06	මහනුවර	පල්ලේවත්ත ගබඩාව	1,040	5.34
07	පුත්තලම	ආණමඩුව ගබඩාව	1,000	6.76
08	පුත්තලම	තබ්බෝව ගබඩාව	1,000	16.25
09	ත්‍රිකුණාමලය	කන්තලේ 01 ගබඩාව	1,000	7.79
10	ත්‍රිකුණාමලය	කන්තලේ 02 ගබඩාව	1,000	3.41
11	හම්බන්තොට	කච්චිගල්ආර (පැරණි) ගබඩාව	1,000	4.53
12	හම්බන්තොට	කච්චිගල්ආර (නව) ගබඩාව	1,000	3.15
13	පොළොන්නරුව	පොළොන්නරුව කලාප කාර්යාලය		13.74
14	හම්බන්තොට	දකුණු කලාප කාර්යාලය		5.20

14. 2014 වර්ෂයේ වී අලෙවි මණ්ඩල අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය

1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩලයේ 13 වන වගන්තිය මඟින් අධ්‍යක්ෂ මණ්ඩල බලතල පිළිබඳව පැහැදිලිව දක්වා ඇත.

යම් නිශ්චල හෝ චංචල දේපල අත්පත් කර ගැනීමට අයිතිය තබා ගැනීම, බද්දට හෝ කුලියට ගැනීම, උකස් කිරීම විකිණීම හෝ වෙනත් යම් ආකාරයකින් අපහරණය කිරීම, වී සහ සහල් මිලදී ගැනීම කෙටීම පෑහීම, අලෙවි කිරීම බෙදා හැරීම, මණ්ඩලයේ ව්‍යාපාරික කටයුතු සඳහා අවශ්‍ය අනුශාංගික කරුණු ඉටු කිරීම, වී සඳහා සහතික මිලක් නියම කිරීම, මණ්ඩලයේ පරිපාලනමය කටයුතුවලට අදාළ වන නීතී රෙගුලාසි සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම, ගබඩා පවත්වා ගෙන යාමට හා වී අලෙවියට අදාළ අවශ්‍ය පියවර ගැනීම, වී, සහල් සැකසීමට අදාළ පර්යේෂණ කටයුතු සිදු කිරීම, වී අලෙවි මණ්ඩලයේ වෙනත් පාර්ශවයන් සමග ගිවිසුම්වලට එළඹීම, ආදී පුළුල් බලතල රාශියක් මෙම වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දී ඇත.

2014 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පිළිබඳ සාරාංශය

2014 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 09ක් පවත්වා ඇති අතර වී තොග සත්‍යාපනය, අබලි වී තොග විකිණීම, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව සඳහා වී නිකුත් කිරීම, සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවට විකුණන ලද වී සඳහා මුදල් අයකර ගැනීම හා අභ්‍යන්තර විගණන සැලැස්ම විධිමත් කිරීමට අදාළව වැදගත් තීරණ රැසක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගෙන ඇති අතර අභ්‍යන්තර විගණක නිළධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කිරීම, විද්‍යුත් ක්‍රමය මඟින් සේවක අර්ථ සාධක අරමුදල සඳහා දායක මුදල් සැපයීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ද කටයුතු කර ඇත.

වී අලෙවි මණ්ඩලයේ කටයුතු සාර්ථකව පවත්වා ගෙන යාම සඳහා මෙම වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය සක්‍රීය දායකත්වය සැපයීමට කටයුතු කරන ලදි. 2014 වර්ෂයේ ද අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ලෙස නීති නිළධාරි රුවන්තිකා ගුණවර්ධන මහත්මිය කටයුතු කරන ලදි.

15. අභ්‍යන්තර විගණනය

1. අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කිරීම.

වී අලෙවි මණ්ඩලය සඳහා අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය 2012.12.05 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝග අංක 06 මඟින් මෙන් ම විගණාධිපතිගේ විගණන වාර්තා මඟින් ද වරින් වර පෙන්වා දීමෙන් අනතුරුව 2014.07.01 දින අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගෙන අභ්‍යන්තර විගණන අංශය අලුතින් පිහිටුවා ඇත. 2014 වර්ෂයේ දී කළමනාකරණ සහකාර නිළධාරියෙකු අභ්‍යන්තර විගණන අංශයට අනියුක්ත කර ඇත.

2. විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවීම සහ විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

2010.12.14 දිනැති PED 55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛනය අනුව විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවා 2014.07.01 දින සිට 2014.12.31 දින දක්වා වූ මාස 06 ක කාල සීමාව සඳහා විගණන සැලැස්ම පිළියෙල කර අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ විගණකාධිපතිගේ අනුමැතිය ලබා ගෙන ක්‍රියාත්මක කර ඇති අතර අදාළ කාලය තුළ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් පවත්වා ඇත.

3. **අභ්‍යන්තර විගණනයේ නිරීක්ෂණ හා නිර්දේශ.**

හඳුනාගත් ක්ෂේත්‍ර අතරින් පහත ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු බව අභ්‍යන්තර විගණක විසින් කළමනාකාරිත්වය වෙත තම නිර්දේශද සහිතව වරින් වර පෙන්වා දී ඇත.

- වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම කඩිනම් කිරීම.
- බැංකු සැසඳුම් යාවත්කාලීනව පිළියෙල කර පවත්වා ගැනීම.
- වාර්ෂික වී තොග සත්‍යාපනය
- විවිධ වැඩසටහන් සඳහා වී මෝල් හිමියන්ගෙන් අයවිය යුතු ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- ගිණුම්වල පවත්නා නිරවුල් නොවූ ශේෂය නිරවුල් කිරීම.
- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය හා ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම.
- පරිගණක ගත තොග පාලන පද්ධතිය ස්ථාපිත කිරීම.
- වී මිලදී ගැනීම, ගබඩා කිරීම සහ නිකුත් කිරීම සම්බන්ධයෙන් විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දීම.
- අලුත්වැඩියා සහ ඉදිකිරීම් සම්බන්ධයෙන් විධිමත් පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

වාර්ෂික ගිණුම් - 2014

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

	සටහන	2014	2013
වත්කම්		රු.	රු.
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	3	424,657,215	411,967,721
කෙරීගෙන යන ප්‍රාග්ධන කටයුතු	4	164,403,048	12,782,996
ආයෝජන	5	370,364,770	347,142,306
		959,425,033	771,893,023
ජංගම වත්කම්			
තොග	6	2,423,454,140	3,954,179,696
වෙළෙඳ සහ අනෙකුත් ලැබීම්	7	2,309,764,951	4,279,953,264
මුදල් සහ මුදල් සමාන දෑ	8	27,753,461	187,598,490
		4,760,972,552	8,421,731,450
මුළු වත්කම්		**5,720,397,585**	**9,193,624,474**
ස්කන්ධය සහ වගකීම්			
දායක ප්‍රාග්ධනය	9	631,484,518	631,484,518
සංචිත අතිරික්තය / (හිඟය)		(5,028,376,426)	(3,919,964,822)
මුළු ස්කන්ධය		(4,396,891,908)	(3,288,480,304)
ජංගම නොවන වගකීම්			
පොලී දරන ණය සහ ණය ගැණුම්	10	6,444,719,871	8,326,971,903
නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ප්‍රතිපාදන	11	2,041,740	1,427,735
විලම්භිත ආදායම	12	367,000,000	192,000,000
		6,813,761,612	8,520,399,638
ජංගම වගකීම්			
වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු මුදල්	13	3,015,454,467	3,752,661,030
පොලී දරණ ණය සහ ණය ගැණුම්	10	288,073,415	209,044,109
මුළු ස්කන්ධය හා වගකීම්		3,303,527,881	3,961,705,139
		5,720,397,585	**9,193,624,474**

මෙම මූල්‍ය ප්‍රකාශ 1971 අංක 38 දරන මුදල් පනතේ අවශ්‍යතාවලට අනුකූලව සකස් කර තිබේ.

....
ගණකාධිකාරී

අධ්‍යක්ෂ මණ්ඩලය මෙම මූල්‍ය වාර්තා පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව වගකීමෙන් බැඳී සිටියි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ,

....
සභාපති අධ්‍යක්ෂ

මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු අංක 35 සිට 54 දක්වා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍යක කොටසකි.

01.03.2017
කොළඹ.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය
2014 දෙසැම්බර් 31 අවසන් වසර සඳහා

	සටහන	2014 රු.	2013 රු.
ආදායම	14	1,554,507,661	7,878,868,461
විකුණුම් පිරිවැය		(1,791,525,409)	(8,000,846,106)
දළ ලාභය		**(237,017,748)**	**(121,977,645)**
වෙනත් ආදායම්	15	93,604,738	114,360,563
පරිපාලන වියදම්		(103,638,540)	(71,785,055)
විකුණුම් හා බෙදාහැරීම් වියදම්		(2,744,206)	(4,626,631)
වෙනත් වියදම්		(538,676)	(391,000)
මූල්‍ය වියදම්	16	(876,642,675)	(951,818,770)
බදු පෙර ලාභ / (අලාභ)		(1,126,977,106)	(1,036,238,538)
ආදායම් බදු (වියදම්) / ප්‍රතිවර්තන		-	-
කාල පරිච්ඡේදය සඳහා ලාභය /(අලාභ)		(1,126,977,106)	(1,036,238,538)
වෙනත් විස්තීර්ණ ආදායම්			
ආයුගණක ලාභ (අලාභ)		45,341	10,572
මුළු විස්තීර්ණ ආදායම්		(1,126,931,765)	(1,036,227,966)

මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු අංක 35 - 54 දක්වා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍යක කොටසකි.

ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය
2014 දෙසැම්බර් 31 දිනට අවසන් වසර

	දායක ප්‍රාග්ධනය රු.	රඳවාගත් ඉපයීම් රු.	එකතුව රු.
2013 ජනවාරි 1 දිනට ශේෂය	631,484,518	(2,361,679,828)	(1,730,195,310)
පූර්ව වසරේ ගැළපීම්	-	(522,057,028)	(522,057,028)
කාල පරිච්ඡේදය සඳහා ලාභය / (අලාභය)	-	(1,036,227,966)	(1,036,227,966)
2013 දෙසැම්බර් 31 දිනට ශේෂය	631,484,518	(3,919,964,822)	(3,288,480,304)
2014 ජනවාරි 1 දිනට ශේෂය	631,484,518	(3,919,964,822)	(3,288,480,304)
පූර්ව වසරේ ගැළපීම්	-	18,520,161	18,520,161
කාල පරිච්ඡේදය සඳහා ලාභ / (අලාභ)	-	(1,126,931,765)	(1,126,931,765)
2014 දෙසැම්බර් 31 දිනට ශේෂය	631,484,518	(5,028,376,426)	(4,396,891,908)

මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු අංක 35 - 54 දක්වා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍යක කොටසකි.

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය
2014 දෙසැම්බර් 31 දිනට අවසන් වසර

	2014 රු.	2013 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ඇති වූ / (භාවිත කළ) මුදල් ප්‍රවාහ		
බදුකරණයට පෙර ලාභය / (අලාභය)	(1,126,977,106)	(1,036,238,538)
ගැළපීම්		
මූල්‍ය පිරිවැය	876,642,675	951,818,770
ක්ෂය කිරීම්	13,974,809	9,661,889
පාරිතෝෂික ශේෂය මත ලබාදුන් පොළිය	164,190	113,410
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	495,156	338,722
ස්ථාවර තැන්පතුවලින් ලද පොළී ආදායම්	(23,222,464)	(33,905,971)
පූර්ව වසරේ ගැළපීම්	18,520,161	(522,057,028)
කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර ආරම්භක ලාභය	(240,402,580)	(630,268,745)
කෙරීගෙන යන වැඩ (වැඩිවීම)/ අඩුවීම	(151,620,052)	68,124,139
තොග වාර්තාවල (වැඩිවීම)/ අඩුවීම	1,530,725,556	(91,242,471)
වෙළෙඳ හා අනෙකුත් ලැබීම් (වැඩිවීම)/ අඩුවීම්	1,970,188,314	(1,835,410,140)
වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු මුදල්වල (වැඩිවීම)/ අඩුවීම	(737,206,563)	837,364,584
මෙහෙයුම්වලින් උත්පාදනය වූ මුදල්	2,371,684,674	(1,651,432,632)
ගෙවන ලද මූල්‍ය පිරිවැය	(876,642,675)	(951,818,770)
ගෙවන ලද ආදායම් බදු	-	-
ගෙවන ලද පාරිතෝෂික	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින්/ ක්‍රියාකාරකම් සඳහා (භාවිත කළ) ශුද්ධ මුදල් ප්‍රවාහය	1,495,042,000	(2,603,251,402)
ආයෝජන ක්‍රියාකාරකම්වලින්/ ක්‍රියාකාරකම් සඳහා (භාවිත කළ) මුදල් ප්‍රවාහය		
දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම	(26,664,302)	(148,983,194)
ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම	(23,222,464)	-
ස්ථාවර තැන්පතුවලින් ලද පොළී ආදායම	23,222,464	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින්/ ක්‍රියාකාරකම් සඳහා (භාවිත කළ) ශුද්ධ මුදල් ප්‍රවාහය	(26,664,302)	(148,983,194)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ඇති වූ/ (භාවිත කළ) මුදල් ප්‍රවාහය		
කොටස් නිකුත් කිරීම	-	-
පොලි දරන ණය හා ණයගැනීම්වලින් ලද මුදල් (උත්පාදන)	-	4,802,428,849
පොලී දරන ණය හා ණය ගැනීම්වල නැවත ගෙවීම්	(1,882,252,032)	(2,097,142,735)
රජයේ ප්‍රදාන ලැබීම්	175,000,000	80,000,000
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ඇති වූ/ (භාවිත කළ) ශුද්ධ මුදල් ප්‍රවාහය	(1,707,252,032	2,785,286,114
මුදල් හා මුදල් සමානතාවල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)	(238,874,334)	33,051,517
වසර ආරම්භයේ මුදල් හා මුදල් සමානතා	(21,445,619)	(54,497,136)
වසර අවසානයේ මුදල් හා මුදල් සමානතා	**(260,319,953)**	**(21,445,619)**

මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු අංක 35 - 54 දක්වා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍යක කොටසකි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2014 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා

1. සංස්ථාපිත තොරතුරු

වී අලෙවි මණ්ඩලය (PMB) 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනතේ විධිවිධාන යටතේ ස්ථාපනය කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එය ශ්‍රී ලංකාවේ නිත්‍ය වශයෙන් ස්ථාපනය වී තිබේ. මෙහි ලියාපදිංචි කාර්යාලය හා ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ 02, යුනියන් පෙදෙසේ අංක 330 ස්ථානයේ පිහිටා තිබේ.

වසර 2000 සිට 2007 දක්වා වූ කාල පරිච්ඡේදය තුළ වී අලෙවි මණ්ඩලය ඇවර කිරීමට නියමිතව තිබුණු අතර එවකට සිටි කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍ය ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් 2007 දෙසැම්බර් 01 දා සිට ක්‍රියාත්මක වන පරිදි වී අලෙවි මණ්ඩලය නැවත සක්‍රිය කරනු ලැබීය.

1.1 මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අවසර ලබා දුන් දිනය.

2017.03.01 දින අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සම්මත කරන ලද යෝජනාවකට අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අවසර දෙන ලදී.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුමවල ස්වභාවය

වී අස්වනු නෙළන සමයේ දී වී මිලදී ගැනීම හා වී විකිණීම වී අලෙවි මණ්ඩලයේ ප්‍රධාන ව්‍යාපාරික කටයුත්ත වේ.

1.3 පිළියෙළ කිරීමේ පදනම

(අ) අනුකූලතාව පිළිබඳ ප්‍රකාශය
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, සාමාන්‍ය කොටස් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය හා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වලින් මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති හා ලංකා ගිණුම්කරණ ප්‍රමිති) වලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබේ.

(ආ) ඇගයීමේ පදනම
අදාළ සටහන් යටතේ ධාරණ අගයට අදාළව සුදුසු හෙළිදරවු කිරීම් සිදු කරන අවස්ථා හැර මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කරනු ලැබීය.

(ඇ) සංසන්දනාත්මක තොරතුරු
වර්තමාන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අවබෝධය වැඩිදියුණු කිරීම සඳහා ද කාල පරිච්ඡේද අතර සංසන්දනාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා ද මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරන ලද සියලු ප්‍රමාණ සඳහා ප්‍රමාණාත්මක, සවිස්තරාත්මක තොරතුරු ඇතුළත් සංසන්දනාත්මක තොරතුරු පසුගිය කාල පරිච්ඡේදයට අදාළව හෙළිදරවු කරනු ලැබේ.

(ඈ) මූල්‍ය හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල්
වී අලෙවි මණ්ඩලයේ ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ ව්‍යාවහාර මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල්වලින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබේ.

වෙනත් ආකාරයකින් සඳහන් කර ඇත්නම් හැර, ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරන ලද සියලු මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියලට වටයා ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2014 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා

(ඉ) තක්සේරු කිරීම් හා තීන්දු උපයෝගී කර ගැනීම.
ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති / ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී හා ඉදිරිපත් කිරීමේ දී කළමනාකාරිත්වය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කිරීම සඳහා මෙන්ම වත්කම්, වගකීම්, ආදායම් හා තක්සේරු කිරීම්වලට බලපාන තීන්දු, තක්සේරු කිරීම් හා උපකල්පන සිදුකිරීම අවශ්‍ය වේ. එසේ භාවිත කරනු ලබන තක්සේරු කිරීම් හා තීන්දු මගින් තථ්‍ය ප්‍රතිඵල වෙනස් විය හැකිය.

තක්සේරු කිරීම් හා බලපවත්වන උපකල්පන පවත්නා පදනම මත සමාලෝචනය කෙරේ. ගිණුම්කරණ තක්සේරු සඳහා සිදුකරනු ලබන ප්‍රතිශෝධන එම කාල පරිච්ඡේදයට පමණක් බලපෑමක් සිදු කරන්නේ නම් හෝ ප්‍රතිශෝධනය සිදුකරනු ලබන කාල පරිච්ඡේදයට හෝ අනාගත කාල පරිච්ඡේදයට බලපෑමක් සිදු කරන්නේ නම් එවැනි ප්‍රතිශෝධන සිදු කරනු ලබන අතර එම ප්‍රතිශෝධන වර්තමාන හා අනාගත කාල ද්විත්වයම සඳහා බලපාන්නේ නම් එවැනි ප්‍රතිශෝධන සිදු කරනු නොලැබේ.

මූල්‍ය ප්‍රකාශනවල පිළිගන්නා ප්‍රමාණ මත ඉතා කැපීපෙනෙන බලපෑමක් සිදු කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ දී තක්සේරු කිරීම්, අනියතතාව හා තීරණාත්මක තීන්දු සම්බන්ධ වැදගත් ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල සටහන් ලෙස ඇතුළත් කරනු ලැබේ.

2. වත්කම් හා ඒවා ඇගයීමේ පදනම

2.1 දේපළ, පිරියත හා උපකරණ

(අ) පිරිවැය
එදිනෙදා සේවා කිරීම සඳහා වන පිරිවැය හැර දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය කිරීම් හා වටිනාකමේ සමුච්චිත හානිකරණ අඩු කර පිරිවැයට දක්වනු ලැබේ. පිළිගැනීමේ නිර්ණායක තෘප්තිමත් කර ඇත්නම්. පිරිවැය දැරීමේ අවස්ථාවේ දී පිරියත හා උපකරණවල කොටස් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය ද එම පිරිවැයට ඇතුළත් වේ.

(ආ) ප්‍රතිෂ්ඨාපන පිරිවැය
කාර්යසාධනය පිළිබඳ මුලින් තක්සේරු කළ ප්‍රමිතියෙන් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රතිෂ්ඨාපනය කිරීම හා නඩත්තු කිරීම වෙනුවෙන් දේපළ, පිරියත හා උපකරණ අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම් සඳහා වැයකරනු ලබන වියදම ප්‍රතිෂ්ඨාපන පිරිවැය ලෙස හැඳින්වේ.

(ඇ) ක්ෂය කිරීම්
පහත සඳහන් කර ඇති පරිදි සමාන වාරිකවලින් එවැනි මුදල් ප්‍රමාණ ලියා හැරීම සඳහා පහත දැක්වෙන තක්සේරු කළ ඵලදායී ජීව කාලය මුළුල්ලේ සියලු දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය හෝ වටිනාකම මත සරල රේඛීය ක්‍රමය භාවිත කරමින් ක්ෂය කිරීම් සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ.

වත්කම් වර්ගය	*වාර්ෂික අනුපාතය*
ගොඩනැගිලි	2.5%
පරිගණක සහ උපාංග	20%
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	20%
කාර්යාලීය උපකරණ	20%
වෙනත් උපකරණ	20%
තරාදි	20%
ජල මීටර්	20%
මෝටර් වාහන	20%

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2014 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා

දේපළ, පිරියත හා උපකරණ අයිතමයන් හා මුලින් හඳුනාගත් වැදගත් කොටස් දේපළ, පිරියත හා උපකරණ අයිතමයන් ඉවත් කළ විට හෝ ඒවා භාවිත කිරීමෙන් තවදුරටත් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කළ නොහැකි තත්ත්වයට පත් වූ විට හෝ එවැනි දේපොළ, පිරියත හා උපකරණ අයිතමයන් පිළිගැනීම අත්හරිනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ අයිතමයන් පිළිගැනීම අත්හැරීමෙන් සිදුවන ලාභය හෝ අලාභය වශයෙන් නිර්ණය කරනු ලබන්නේ එවැනි වත්කමක් විකුණා ලත් මුදලත් එහි ධාරණ වටිනාකමත් යන දෙකේ වෙනස වන අතර වත්කම පිළිගැනීම අත්හැරීමේ දී එම ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයෙහි දක්වනු ලැබේ.

වත්කමේ අවශේෂ වටිනාකම, ඵලදායී ජීව කාලය හා ක්ෂය කිරීමේ ක්‍රම සෑම මූල්‍ය වර්ෂයකම අවසානයේ දී සමාලෝචනය කරන අතර යෝග්‍ය වේ නම්, අනාගතය සඳහා ද ගළපනු ලැබේ.

2.2 තොග

යල්පිනූ හෝ අඩුවෙන් විකිණෙන අයිතම සඳහා නිසිපරිදි ප්‍රතිභාග ලබාදීමෙන් අනතුරුව පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට තොග අගය කර ඇත. සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාවලිය තුළින් තොග විකිණිය හැකි මිලෙන් විකිණීම සම්පූර්ණ කිරීම සඳහා තක්සේරු කළ පිරිවැය සහ විකිණීම සඳහා අවශ්‍ය තක්සේරු කළ පිරිවැය අඩු කිරීමෙන් ශුද්ධ උපලබ්ධි වටිනාකම ලැබේ.

2.3 මූල්‍ය වත්කම්

(අ) ආරම්භක පිළිගැනීම

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට පිළිගනු ලබන මූල්‍ය වත්කම්, ණය හා ලැබිය යුතු මුදල්, කල් පිරෙනතුරු තබාගන්නා ආයෝජන හෝ විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් ලෙස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 විෂය පථය යටතේ වන මූල්‍ය වත්කම් වර්ගීකරණය කරනු ලැබේ.

සියලු මූල්‍ය වත්කම් මූලිකව ඒවායේ සාධාරණය අගයට පිළිගන්නා අතර ලාභය හා අලාභය තුළින් සාධාරණ අගයට පිළිනොගන්නා වත්කම් සම්බන්ධයෙන් වන විට ඍජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැයට හඳුනාගනු ලැබේ.

(ආ) පසු අවස්ථාවක තක්සේරු කිරීම

මූල්‍ය වත්කම් පසුව තක්සේරු කිරීම පහත දක්වා ඇති වර්ගීකරණය මත රඳා පවතී.

ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට පිළිගන්නා ලද මූල්‍ය වත්කම්

වී අලෙවිකරණ මණ්ඩලය ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට පිළිගන්නා මූල්‍ය වත්කම් ලෙස කිසිදු වත්කමක් නම් කර නොමැත.

ණය සහ ලැබිය යුතු මුදල්

සක්‍රිය වෙළෙඳපොළක මිල සඳහන් කර නොමැති නියමිත දිනට ගෙවීම් සිදු කළ හැකි හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සිදු කළ හැකි ව්‍යුත්පන්න නොකරන ලද මූල්‍ය වත්කම් ණය හා ලැබිය යුතු මුදල් ලෙස හැඳින්වේ. ආරම්භක තක්සේරුවෙන් අනතුරුව, එවැනි මූල්‍ය වත්කම් ඵලදායී පොලී අනුපාතික ක්‍රමය (EIR) භාවිත කරමින් ක්‍රමක්ෂය කළ පිරිවැයෙන් හානිකරණ පාඩු අඩු කිරීමෙන් පසුව තක්සේරු කරනු ලැබේ. අත්පත් කර ගැනීම මත ලබා දෙනු ලබන වට්ටමක් හෝ වාරිකයක් සහ සඵල පොලි අනුපාතික ක්‍රමයේ අත්‍යවශ්‍ය කොටසක් වන ගාස්තු හා පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය කළ පිරිවැය ගණනය කරනු ලැබේ. ඵලදායී පොලී අනුපාතික ක්‍රමයෙන් ක්‍රමක්ෂය කිරීම් ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ ඇතුළත් කරනු ලැබේ. හානිකරණයෙන් ඇති වන අලාභ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැයෙහි හඳුනාගනු ලැබේ.

වී අලෙවි මණ්ඩලය වෙළෙඳ හා අනෙකුත් ලැබියයුතු මුදල්, ස්ථාවර තැන්පතු, මුදල් හා මුදල් සමානතා ණය හා ලැබියයුතු මුදල් ලෙස වර්ගීකරණය කරනු ලබයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2014 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා

කල් පිරෙන තුරු තබාගන්නා මූල්‍ය වත්කම්

කල් පිරෙනතුරු තබාගන්නා මූල්‍ය වත්කම් යනු වී අලෙවි මණ්ඩල කළමනාකාරිත්වයට කල් පිරෙනතුරු තබා ගැනීමේ හැකියාවත් ඇති එමෙන්ම කල් පිරෙන තුරු තබාගැනීමට ධනාත්මක අභිප්‍රායක් ඇති නියමිත දිනට ගෙවිය යුතු හා නිශ්චය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්ය. මුල් ඇගයීමෙන් අනතුරුව කල් පිරෙන තුරු තබාගන්නා මූල්‍ය වත්කම් ඵලදායී පොලී අනුපාතික ක්‍රමය (EIR) භාවිත කරමින් ක්‍රමක්ෂය කළ පිරිවැයෙන් හානිකරණ පාඩු අඩු කිරීමෙන් පසුව තක්සේරු කරනු ලැබේ. අත්පත් කර ගැනීම මත ලබා දෙනු ලබන වට්ටමක් හෝ වාරිකයක් සහ සඵල පොලී අනුපාතික ක්‍රමයේ අත්‍යවශ්‍ය කොටසක් වන ගාස්තු හා පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය කළ පිරිවැය ගණනය කරනු ලැබේ. ඵලදායී පොලී අනුපාතික ක්‍රමයෙන් ක්‍රමක්ෂය කිරීම් ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ ඇතුළත් කරනු ලැබේ. හානිකරණයෙන් ඇති වන අලාභ ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැයෙහි හඳුනාගනු ලැබේ.

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල පරිච්ඡේදය තුළ වී අලෙවි මණ්ඩලය සතුව කල් පිරෙනතුරු තබා ගන්නා වත්කම් කිසිවක් නොතිබුණි.

විකිණීමට තිබෙන මූල්‍ය ආයෝජන

වී අලෙවි මණ්ඩලය විකිණීමට තිබෙන වත්කම් ලෙස කිසිදු මූල්‍ය වත්කමක් නම් කර නොමැත.

(ඇ) මූල්‍ය වත්කම් හානිකරණය කිරීම

වී අලෙවි මණ්ඩලය සෑම වාර්තාකරණ දිනකම මූල්‍ය වත්කමක් හෝ වී අලෙවි මණ්ඩලයේ මූල්‍ය වත්කමක් හානිකරණයට ලක් වී ඇති බවට යම් වාස්තවික සාක්ෂ්‍යයක් ඇත්දැයි තක්සේරු කරනු ලබයි. වත්කමේ (සිදු වූ අලාභයන්) මුල් හඳුනාගැනීමෙන් අනතුරුව සිදුවන එක් සිදුවීමක් හෝ සිදුවීම් ගණනාවක ප්‍රතිඵලයන් ලෙස හානිකරණයක් සිදුවී ඇති බවට වාස්තවික සාක්ෂ්‍ය ඇත්නම් විශ්වසනීය ලෙස තක්සේරු කළ හැකි වන මූල්‍ය වත්කමේ හෝ වී අලෙවි මණ්ඩලයට අයත්වන මූල්‍ය වත්කමේ තක්සේරු කළ අනාගත මූල්‍ය ප්‍රවාහ මත බලපෑමක් එම අලාභය නිසා සිදු වේ නම් මූල්‍ය වත්කම හෝ වී අලෙවි මණ්ඩලයේ මූල්‍ය වත්කම් හානිකරණය වී ඇති බව සලකනු ලැබේ. ණය ගැතියන් හෝ වී අලෙවි මණ්ඩලයේ ණය ගැතියන් කැපී පෙනෙන මූල්‍ය දුෂ්කරතා අත් විඳියි නම් හෝ පොලී හා ප්‍රධාන ගෙවීම්වල පැහැර හැරීමක් හෝ වස්තුභංගත්වයට පැමිණීම හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානගතවීමක් හා ගෙවීම් පැහැර හැරීමට අදාළ වන හිඟ මුදල් හා ආර්ථික තත්ත්වයේ වෙනස්වීමක් වැනි තක්සේරු කළ අනාගත මූල්‍ය ප්‍රවාහයේ මිණිය හැකි අඩු වීමක් පවතින බව නිරීක්ෂණය කළ හැකි දත්තවලින් පැහැදිලිවීම හානිකරණයක් සිදු වී ඇති බවට වන සාක්ෂ්‍ය වේ.

ක්‍රමක්ෂය කළ පිරිවැයට ගැනෙන මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂය කළ පිරිවැයට ගැනෙන මූල්‍ය වත්කම් සඳහා ඒවාට පෞද්ගලික වන පරිදි හා පෞද්ගලිකව වැදගත් නොවන මූල්‍ය වත්කම් සඳහා සාමුහිකව හෝ හානිකරණයට ලක්වීම පිළිබඳව සාක්ෂ්‍ය ඇත්දැයි වී අලෙවි මණ්ඩලය පළමුව තක්සේරු කරනු ලැබේ. වැදගත් හෝ වැදගත් නොවන පෞද්ගලිකව තක්සේරු කරනු ලබන මූල්‍ය වත්කමක් සඳහා හානිකරණයක් පවතින බවට වාස්තවික සාක්ෂ්‍ය නොමැති බවට වී අලෙවි මණ්ඩලය තීරණය කරන්නේ නම්, එම වත්කම වී අලෙවි මණ්ඩලයේ සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම්වලට ඇතුළත් කරනු ලබන අතර ඒවා හානිකරණ සඳහා සාමුහිකව තක්සේරු කරනු ලැබේ. පෞද්ගලිකව තක්සේරු කරනු ලබන වත්කමක හානිකරණ අලාභ තිබේ නම් හෝ අඛණ්ඩව හානිකරණ අලාභ පවතියි නම් හෝ හානිකරණ අලාභ පවතින බවට හඳුනා ගන්නා ලද්දේ නම්, එබඳු වත්කම් හානිකරණ තක්සේරු කිරීම්වලට සාමුහිකව ඇතුළත් නොකරයි.

හානිකරණ අලාභ සිදු වී ඇති බවට වාස්තවික සාක්ෂ්‍ය ඇත්නම්, වත්කමේ ධාරණ ප්‍රමාණය හා තක්සේරු කළ අනාගත මූල්‍ය ප්‍රවාහයේ (මේ වන තෙක් වැය නොකරන ලද අනාගත අපේක්ෂිත ණය හානි හැර) වර්තමාන අගය යන අගයන් දෙක අතර වෙනස ලෙස හානිකරණ අලාභය තක්සේරු කරනු ලැබේ. තක්සේරු කළ අනාගත මූල්‍ය ප්‍රවාහයේ වර්තමාන අගය මූල්‍ය වත්කමේ මුල් සඵල පොලී අනුපාතිකයට වට්ටම් කරනු ලැබේ. ණය මුදලක් සඳහා විචල්‍ය පොලී අනුපාතයන් ඇත්නම්, හානිකරණ අලාභය තක්සේරු කිරීම සඳහා වන වට්ටම් අනුපාතය ප්‍රවර්තන සඵල පොලී අනුපාතය වේ.

ප්‍රතිභාග ගිණුමක් භාවිත කිරීම තුළින් වත්කමේ ධාරණ අගය අඩු වන අතර අලාභයේ ප්‍රමාණය ආදායම් ප්‍රකාශයේ හඳුනාගැනේ. අඩු වූ ධාරණ ප්‍රමාණය මත පොලී ආදායම උපචිත වීම අඛණ්ඩව සිදුවන අතර හානිකරණ අලාභය තක්සේරු කිරීමේ අරමුණින් අනාගත මූල්‍ය ප්‍රවාහය වට්ටම් කිරීමට භාවිත කරන පොලී අනුපාතය භාවිත කරමින් පොලී ආදායම උපචිත වේ. පොලී ආදායම ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ කොටසක් වශයෙන් ගිණුම්ගත කරයි. අනාගතයේ ප්‍රතිලභ්‍ය වීම පිළිබඳව සැබෑ වන අපේක්ෂාවක් නොමැති විට හා සියලුම අතිරේක මුදල් වී අලෙවි මණ්ඩලයට උපලබ්ධි වී ඇති විට හෝ මාරු කර ඇති විට ආශ්‍රිත ප්‍රතිභාග සමඟ ණය ලියා හරිනු ලැබේ. හානිකරණය හඳුනා ගැනීමෙන් පසුව ඇතිවන සිදුවීමක් හේතුවෙන් පසුව එළැඹෙන වසර තුළ තක්සේරු කළ හානිකරණ අලාභයේ ප්‍රමාණය වැඩි වේ නම් හෝ අඩු වේ නම්, ප්‍රතිභාග ගිණුම ගැළපීම මගින් මුලින් හඳුනාගත් හානිකරණ අලාභය වැඩිකිරීම හෝ අඩුකිරීම සිදු කරනු ලැබේ. අනාගත ලියාහැරීමක් පසුව ආපසු අය කර ගතහොත්, ආපසු අය කර ගැනීම ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැයට බැර කරනු ලැබේ.

(ඈ) මුදල් හා මුදල් සමාන දෑ

කලින් දන්නා මුදල් ප්‍රමාණවලට පහසුවෙන් පරිවර්තනය කළ හැකි සහ අගය වෙනස් වීමේ සුළු අවදානමකට පමණක් යටත් ඉහළ ද්‍රවශීලතාවක් සහිත කෙටිකාලීන ආයෝජනවලින් හා අත ඇති මුදල්වලින් සහ ඉල්ලුම් තැන්පතුවලින් මුදල් හා මුදල් සමානතා සමන්විත වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණු සඳහා මුදල් හා මුදල් සමාන දෑ ලෙස සලකනු ලබන්නේ අත ඇති මුදල් හා තවමත් ගෙවීමට තිබෙන බැංකු අයිරාව අඩු කළ බැංකු තැන්පතුය. අත්පත් කර ගත් දිනයේ සිට මාස තුනක් හෝ ඊට අඩු කාලයක් වැනි කෙටි කාලයකින් කල් පිරෙන ආයෝජන ද මුදල් සමාන දෑ වශයෙන් සලකනු ලැබේ.

2.4 මූල්‍ය වගකීම්

(අ) මූලික පිළිගැනීම හා තක්සේරු කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 විෂය පථය යටතේ වන මූල්‍ය වගකීම්, ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට පිළිගනු ලබන මූල්‍ය වගකීම් හෝ යෝග්‍ය පරිදි ණය මුදල් හා ණයට ගැනීම් වශයෙන් වර්ගීකරණය කර තිබේ. මූලික පිළිගැනීමේ දී වී අලෙවි මණ්ඩලය එහි මූල්‍ය වගකීම්වල වර්ගීකරණය නිර්ණය කරයි.

සියලු මූල්‍ය වගකීම් මූලික වශයෙන් එහි සාධාරණ අගයට පිළිගනු ලබන අතර ණය මුදල් හා ණය ගැනීම් සම්බන්ධයෙන් ක්‍රමක්ෂය කළ පිරිවැයට පිළිගනු ලැබේ. මෙයට ඍජු ගනුදෙනු පිරිවැය ද ඇතුළත් වේ.

වී අලෙවි මණ්ඩලයේ මූල්‍ය වගකීම්වලට වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු මුදල් හා ණය මුදල් හා ණය ගැනීම් ද ඇතුළත් වේ.

(ආ) පසුව සිදුකරනු ලබන තක්සේරු කිරීම්

මූල්‍ය වගකීම්වල තක්සේරු කිරීම් පහත සඳහන් කර ඇති පරිදි ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

ලාභය හා අලාභය හරහා සමාන අගයට පිළිගනු ලබන මූල්‍ය වගකීම්.

ලාභය හා අලාභය හරහා සාධාරණ අගයට පිළිගනු ලබන මූල්‍ය වගකීම්වලට වෙළෙඳාම සඳහා තබන ලද මූල්‍ය වගකීම් හා මූලික හඳුනාගැනීමෙන් අනතුරුව ලාභය හා අලාභය හරහා සාධාරණ අගයට පිළිගනු ලබන මූල්‍ය වගකීම් ඇතුළත් වේ.

නුදුරු අනාගතයේ දී විකිණීමේ අරමුණින් සඳහා අත්පත් කර ගන්නා මූල්‍ය වගකීම් වෙළෙඳාම සඳහා තබාගන්නා මූල්‍ය වගකීම් ලෙස හඳුනා ගනු ලැබේ. මෙම ප්‍රවර්ගයට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 මගින් නිර්වචනය කරන ලද ඉදිරි රැකුම් සම්බන්ධතාවල දී ඉදිරි රැකුම් මෙවලම් ලෙස නම් නොකරන ලද වී අලෙවි මණ්ඩලය ඇතුළත් වූ ව්‍යුත්පන්න කළ හැකි මූල්‍ය මෙවලම් ඇතුළත් වේ. සඵලදායී ඉදිරි රැකුම් මෙවලම් ලෙස නම් කර නොමැති නම්, වෙන් කරන ලද හා ඔබ්බවන ලද ව්‍යුත්පන්න ද වෙළෙඳාම සඳහා තබාගන්නා වගකීම් ලෙස වර්ගීකරණය කෙරේ.

වෙළෙඳාම සඳහා තබන ලද වගකීම්වලින් ලබා ගත් ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශයේ හඳුනාගැනේ.

වී අලෙවි මණ්ඩලය මගින් මූලික පිළිගැනීමේ දී ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයට පිළිගනු ලැබූ කිසිදු මූල්‍ය වගකීමක් නොමැත.

(ඇ) ණය මුදල් හා ණයට ගැනීම්

මූලික පිළිගැනීමෙන් අනතුරුව, පොළී උත්පාදන ණය මුදල් හා ණයට ගැනීම් සඵල පොළී අනුපාතික ක්‍රමය උපයෝගී කර ගනිමින් පසු අවස්ථාවක ක්‍රමක්ෂය කළ පිරිවැයට තක්සේරු කරනු ලැබේ. සඵල පොළී අනුපාත ක්‍රමය භාවිත කර ක්‍රමක්ෂය කිරීමේ ක්‍රියාවලිය තුළින් ද පිළිගැනීම අත්හරින ලද වගකීම් ඇති විට ලාභ හා අලාභ ආදායම් ප්‍රකාශනයේ පිළිගැනේ. අත්පත් කර ගැනීම මත ලබා දෙනු ලබන වට්ටමක් හෝ වාරිකයක් සහ සඵල පොළී අනුපාතික ක්‍රමයේ අත්‍යවශ්‍ය කොටසක් වන ගාස්තු හා පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය කළ පිරිවැය ගණනය කරනු ලැබේ. ඵලදායී පොළී අනුපාතික ක්‍රමයෙන් ක්‍රමක්ෂය කිරීම් ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමේ ඇතුළත් කරනු ලැබේ.

වී අලෙවි මණ්ඩලය මගින් පොළී උත්පාදන ණය මුදල් හා ණයට ගැනීම් හා වෙනත් ණයට ගැනීම්, ණය මුදල් හා ණයට ගැනීම් ලෙස වර්ගීකරණය කර තිබේ.

(ඈ) මූල්‍ය සහතික කොන්ත්‍රාත්තු

වී අලෙවි මණ්ඩලය මගින් නිකුත් කරන ලද මූල්‍ය සහතික කොන්ත්‍රාත්තු යනු ණය මෙවලමේ නියමවලට අනුව ගෙවිය යුතු අවස්ථාවේ ගෙවීමක් සිදු කිරීමට සුවිශේෂී ණයගැතියකු අසමත් වීම නිසා එම මූල්‍ය මෙවලම මගින් සිදුකරන අලාභය එම මූල්‍ය මෙවලම දරන පුද්ගලයා වෙත ප්‍රතිපූර්ණය කිරීම සඳහා ගෙවීමක් සිදුකිරීම අවශ්‍ය වන කොන්ත්‍රාත් වේ. මෙම මූල්‍ය සහතික කොන්ත්‍රාත්තුව වගකීමක් වශයෙන් මූලිකව පිළිගන්නා අතර සහතික නිකුත් කිරීමට ඍජුව දායක වන ගනුදෙනු පිරිවැයට ගළපන ලද සාධාරණ අගයට ඒවා පිළිගනු ලැබේ. පසු අවස්ථාවක දී, මූල්‍ය වාර්තාකරණ දිනට වර්තමාන වගකීම් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය වන වියදම පිළිබඳ විශිෂ්ටතම තක්සේරුව හා පිළිගත් අගයෙන් සමුච්චිත ක්‍රමක්ෂය අඩු කිරීමෙන් ලැබෙන අගය යන දෙකෙන් වැඩිම අගයට තක්සේරු කරනු ලැබේ.

පිළිගැනීම අත්හැරීම

වගකීම යටතේ පවතින බැඳීමෙන් නිදහස්වීම හෝ අවලංගු කිරීම හෝ කල් ඉකුත් වීම සිදු වූ විට මූල්‍ය වගකීම පිළිගැනීම අත්හරිනු ලැබේ. පවතින මූල්‍ය වගකීමක් එම ණයහිමියා විසින්ම සාරානුකූලව වෙනස් වන නියමයන් මත පදනම් වන වෙනත් මූල්‍ය වගකීමකින් ප්‍රතිස්ථාපනය කරනු ලැබූ විට හෝ පවතින වගකීමක නියමයන් සාරානුකූලව වෙනස් කළ විට එවැනි හුවමාරුකිරීමක් හෝ වෙනස් කිරීමක් මුල් වගකීම පිළිගැනීම අත්හැරීමක් ලෙස සලකනු ලබන අතර අළුත් වගකීම පිළිගැනීමක් ලෙස ද සලකනු ලැබේ. අදාළ ධාරණ ප්‍රමාණවල වෙනස ආදායම් ප්‍රකාශයේ හඳුනාගැනේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2014 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය මෙවලම් හිලව් කිරීම

පිළිගත් ප්‍රමාණ හිලව් කිරීමට දැනට බලාත්මකව පවතින නෛතික අයිතිවාසිකම් පවතී නම් සහ ශුද්ධ පදනම මත නිරවුල් කිරීමට අභිමතයක් තිබේ නම් හෝ වත්කම් එකිනෙකට සමගාමීව උපලබ්ධි කිරීමට හා වගකීම් නිරවුල් කිරීමට අවශ්‍ය වේ නම්, මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කරනු ලබන අතර ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ශුද්ධ ප්‍රමාණය වාර්තා කරනු ලැබේ.

2.5 ප්‍රතිපාදන

වී අලෙවි මණ්ඩලයට අදාළ වගකීම නිරවුල් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත වූ සම්පත් ගලනයක් සිදුවිය හැකි එමෙන්ම බැඳීමේ ප්‍රමාණය පිළිබඳ විශ්වාසනීය තක්සේරුවක් කළ හැකි පූර්ව සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් සිදුවන වර්තමාන බැඳීමක් (නෛතික හෝ අනුමිත) ඇති වන අවස්ථාවක ප්‍රතිපාදන පිළිගනු ලැබේ. යම් ප්‍රතිපාදන ප්‍රමාණයක් හෝ සියලුම ප්‍රතිපාදන ප්‍රතිපූරණය කිරීමට වී අලෙවි මණ්ඩලය අපේක්ෂා කරන විට එය සත්‍ය වශයෙන්ම ස්ථිර වේ නම් පමණක් මෙම ප්‍රතිපූර්ණය වෙනම වත්කමක් වශයෙන් පිළිගනියි. යම් ප්‍රතිපාදනයකට අදාළ වන වියදම යම් ප්‍රතිපූරණයක් අඩුකර ආදායම් ප්‍රකාශනයේ ඉදිරිපත් කෙරේ. මුදලේ කාල වටිනාකමේ බලපෑම වැදගත් වන්නේ නම්, මුදලේ කාල වටිනාකම පිළිබඳ වර්තමාන වෙළඳපොළ තක්සේරුව මගින් ද, යෝග්‍ය වන පරිදි සහ වගකීමට සුවිශේෂී වූ අවදානම ද පිළිබිඹු කෙරෙන පූර්ව වෙළෙඳ අනුපාතයක් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහය වට්ටම් කිරීමෙන් ප්‍රතිපාදන නිශ්චය කරනු ලැබේ. වට්ටම් කිරීම භාවිත කරන අවස්ථාවල කාලය ගත වීම හේතුවෙන් ප්‍රතිපාදන ඉහළ යෑම පොළී වියදම ලෙස හඳුනාගනු ලැබේ.

2.6 රජයේ ප්‍රදාන

ප්‍රදාන ලැබෙන බවට හා අමුණා ඇති සියලු කොන්දේසිවලට අනුගත වන බවට යුක්ති සහගත සහතිකයක් පවතින විට, රජයේ ප්‍රදාන පිළිගනියි. ප්‍රදානය වැය අයිතමයකට අදාළ වන විට, හිලව් කිරීමට අපේක්ෂිත පිරිවැය වැය වන කාල පරිච්ඡේදය මුළුල්ලේ විධිමත් පදනමක් මත ආදායම ලෙස පිළිගැනේ. ප්‍රදානය වත්කමකට අදාළ වන විට, අදාළ වත්කමේ අපේක්ෂිත ඵලදායී ආයු කාලය මුළුල්ලේ සමාන ප්‍රමාණවලින් එය ආදායමක් වශයෙන් පිළිගැනේ.

කණ්ඩායමට මුදල් නොවන ප්‍රදාන ලැබෙන විට වත්කම් හා ප්‍රදානය නාමමාත්‍ර ප්‍රමාණවලින් මුළුමනින් වාර්තාකරණ අතර සමාන වාර්ෂික වාරිකවලින් බලපවත්වන වත්කමේ ප්‍රතිලාභය භාවිත කරන රටාවෙන් අපේක්ෂිත ඵලදායී ආයු කාලය මුළුල්ලේ ලාභයට හෝ අලාභයට නිදහස් කෙරේ.

වර්තමානයේ අදාළ වන වෙළඳපොළ අනුපාතිකයට වඩා පහළ පොළී අනුපාතිකයක් සමඟ රජය හෝ අදාළ ආයතනවලින් ණය මුදල් හෝ සමාන සහායක් ලබා දෙන අවස්ථාවක මෙම වාසිදායක පොළියේ බලපෑම රජයේ ප්‍රදානය ලෙස සලකනු ලබයි.

2.7 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පාරිතෝෂික

පුරෝකථනය කළ ඒකක බැර ක්‍රමය භාවිත කරමින් වාර්තාකරණ දිනයේ දී නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම වන්නේ මූල්‍ය තත්ව ප්‍රකාශයේ පිළිගන්නා වගකීම වේ. ඇතිවන ආයුගණක ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශය තුළ ක්ෂණිකව පිළිගැනේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2014 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා

2.8 ආදායම් පිළිගැනීම

වී අලෙවි මණ්ඩලයට ආර්ථික ප්‍රතිලාභ ගැලීමේ හැකියාවක් පවතින ප්‍රමාණයට ආදායම පිළිගන්නා අතර ආදායම හෝ දරන ලද හෝ දැරීමට තිබෙන ඒ ආශ්‍රිත පිරිවැය විශ්වසනීය ලෙස තක්සේරු කළ හැකිය. ලැබුණු හා ලැබීමට නියමිත ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයෙන් වෙළඳ වට්ටම් හා විකුණුම් බදු අඩු කිරීමෙන් ආදායම තක්සේරු කරනු ලැබේ.

2.9 භාණ්ඩ විකිණීම

වැදගත් අවදානම් සහ භාණ්ඩවල අයිතිය පිළිබඳ පාරිතෝෂික ද, භාණ්ඩ පිටත් කර හරින අවස්ථාවේම ගැණුම්කරු වෙත මාරු කිරීමේ අවස්ථාවේ දී භාණ්ඩ විකිණීමෙන් ලබා ගන්නා ආදායම පිළි ගැනේ.

2.10 පොළී ආදායම

මූල්‍ය මෙවලමේ අපේක්ෂිත ආයු කාලය තුළින් තක්සේරු කරන ලද අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් තථ්‍ය වශයෙන් වට්ටම් කරනු ලබන අනුපාතය වන සඵල පොළී අනුපාතය (EIR) භාවිත කරමින් එය උපචය වන පරිදි හෝ කෙටිකාලීනව මූල්‍ය වත්කමේ ශුද්ධ ධාරණ වටිනාකමට යෝග්‍ය වන පරිදි පොළී ආදායම වාර්තා කෙරේ.

ආදායම් ප්‍රකාශයේ අනෙකුත් ආදායම්වල පොළී ආදායම ඇතුළත් කෙරේ.

2.11 බදු කුලී ආදායම

බදු කුලී ආදායම උපචිත පදනමකින් පිළිගැනේ.

2.12 වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනමින් හඳුනාගැනේ.

2.13 අලුතින් නිකුත් කරන ලද එහෙත් මේ වන විටත් බලාත්මක නොවූ ගිණුම්කරණ ප්‍රමිති

නිකුත් කරන ලද, එහෙත් මෙම මූල්‍ය ප්‍රකාශන නිකුත් කරන දිනය වන විටත් බලාත්මක නොවූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති පහත දක්වා ඇත. මෙම ප්‍රමිති බලාත්මක වීමෙන් අනතුරුව ඒවා අනුගමනය කිරීමට වී අලෙවි මණ්ඩලය අපේක්ෂා කරයි. මෙම මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධ කරන ලද දින වන විට ද මෙම නව ප්‍රමිති අදාළ කර ගැනීමෙන් මූල්‍ය ප්‍රකාශන කෙරෙහි ඇති විය හැකි බලපෑම යුක්ති සහගත අන්දමින් තක්සේරු කිරීමට නොහැකි විය.

(i) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 9 - මූල්‍ය මෙවලම්ඃ වර්ගීකරණය හා තක්සේරු කිරීම.

නිකුත් කරන ලද SLFRS 9 මගින් ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා කටයුතු කරන පළමු අදියර පිළිබිඹු වන අතර එය මූල්‍ය වත්කම් හා වගකීම් වර්ගීකරණය හා තක්සේරු කිරීමට අදාළ වේ.

(ii) SLFRS 13 - සාධාරණ අගය තක්සේරු කිරීම

SLFRS 13 මගින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති යටතේ සාධාරණ අගය තක්සේරු කිරීම් සියල්ල සඳහා තනි මාර්ගෝපදේශ ප්‍රභවයක් ස්ථාපනය කරයි. SLFRS 13 මගින් සියලු සාධාරණ අගය තක්සේරු කිරීම් සඳහා මාර්ගෝපදේශ SLFRS යටතේ ලබාදෙයි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2014 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා

3. දේපළ, පිරියත හා උපකරණ

3.1 පිරිවැය

	2014.01.01 දිනට ශේෂය රු.	එකතු කිරීම් රු.	බැහැර කිරීම් රු.	2014.12.31 දිනට ශේෂය රු.
ඉඩම් සහ ගොඩනැගිලි	413,767,451	23,811,248	-	437,578,699
පරිගණක සහ උපාංග	2,722,960	1,275,828	-	3,998,788
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	3,257,400	633,070	-	3,890,470
කාර්යාලීය උපකරණ	1,939,414	102,312	-	2,041,726
වෙනත් උපකරණ	100,320	841,844	-	942,164
තරාදි	219,223	-	-	219,223
තෙතමාපක	4,704,600	-	-	4,704,600
මෝටර් වාහන	3,322,135	-	-	3,322,135
	430,033,504	26,664,302	-	456,697,806

3.2 ක්ෂය කිරීම්

	2014.01.01 දිනට ශේෂය රු.	එකතු කිරීම් රු.	බැහැර කිරීම් රු.	2014.12.31 දිනට ශේෂය රු.
ඉඩම් සහ ගොඩනැගිලි	9,857,195	10,493,007	25,750	20,324,452
පරිගණක සහ උපාංග	972,430	717,159	-	1,689,590
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	1,415,271	691,226	-	2,106,498
කාර්යාලීය උපකරණ	542,936	399,887	-	942,823
වෙනත් උපකරණ	26,752	94,315	-	121,067
තරාදි	69,951	43,845	-	113,795
තෙතමාපක	2,923,047	940,920	-	3,863,967
මෝටර් වාහන	2,258,200	620,200	-	2,878,400
	18,065,783	14,000,559	25,750	32,040,591

3.3 ශුද්ධ පොත් වටිනාකම

	2014.12.31 දිනට ශේෂය රු.	2013.12.31 දිනට ශේෂය රු.
ඉඩම් සහ ගොඩනැගිලි	417,254,248	403,910,256
පරිගණක සහ උපාංග	2,309,198	1,750,530
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	1,783,973	1,842,129
කාර්යාලීය උපකරණ	1,098,903	1,396,477
වෙනත් උපකරණ	821,097	73,568
තරාදි	105,428	149,273
තෙතමාපක	840,633	1,781,553
මෝටර් වාහන	443,735	1,063,935
	424,657,215	411,967,721

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2014 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා

4. කෙරීගෙන යන වැඩ	**2014** රු.	**2013** රු.
ආරම්භක ශේෂය	12,782,996	80,907,135
ඉඩම් හා ගොඩනැගිලි ගිණුමට මාරු කළා	(23,811,248)	(145,990,267)
කාල පරිච්ඡේදය සඳහා ලබාදෙන ලද අත්තිකාරම්	175,431,300	77,866,128
	164,403,048	12,782,996

5. ආයෝජන	**2014** රු.	**2013** රු.
ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව	370,364,770	347,142,306
	370,364,770	347,142,306

6. තොග වාර්තා	**2014** රු.	**2013** රු.
වී තොග - නාඩු	1,692,217,233	2,994,534,129
වී තොග - සම්බා	673,332,530	901,872,520
මාර්ගස්ථ බඩු	54,385,222	54,385,222
සෝයා බෝංචි තොග	3,302,853	3,302,853
හාල් තොග	84,972	84,972
තොග අයිතම	131,330	-
	2,423,454,140	3,954,179,696

7. වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු මුදල්	**2014** රු.	**2013** රු.
වෙළඳ ණයගැතියෝ (7.1)	2,271,997,405	4,237,195,633
අඩු කළා - හානිකරණ සඳහා ප්‍රතිපාදන	-	-
	2,271,997,405	4,237,195,633
විවිධ ණයගැතියන්		
ණය සහ අත්තිකාරම් (7.2)	27,841,397	33,498,658
වෙනත් ලැබිය යුතු මුදල් (7.3)	9,906,148	9,238,973
ඇප සහ තැන්පතු (7.4)	20,000	20,000
	2,309,764,951	4,279,953,264

7.1 වෙළඳ ණය ගැතියන්	**2014** රු.	**2013** රු.
සමූපකාර තොග වෙළඳ සංස්ථාව	462,589,308	1,404,922,600
1. සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය - වී විකිණීම සඳහා	332,688,410	1,385,027,500
ආහාර දෙපාර්තමේන්තුව	425,951,745	440,545,635
ලංකා සතොස	77,526,708	79,928,013
2. සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය - සහල් අපනයනය	288,064,664	348,537,877
ශ්‍රී ලංකා ගුවන් හමුදාව	4,307,000	4,307,000
ශ්‍රී ලංකා යුධ හමුදාව	18,209,608	113,209,608
ආහාර දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු මුදල්	10,591,838	10,591,838
මෝල් හිමියන්ගෙන් ලැබිය යුතු මුදල්	23,388,499	26,372,720
අම්පාර ප්‍රාදේශීය ලේකම්ගෙන් ලැබිය යුතු - WFP	197,912,629	
හම්බන්තොට ප්‍රාදේශීය ලේකම්ගෙන් ලැබිය යුතු - WFP	18,351,743	
අපනයනය සඳහා සහල් මෝල්හිමියන්	219,848,491	231,186,080
සහල් මෝල් හිමියන් (ණය පදනම මත වී විකිණීම සඳහා)	68,993,349	68,993,349
මිලදී ගැනීම් පාලක ගිණුම	49,743,530	49,743,530
හඳුනා නොගත් වී මිලදී ගැනීම්	73,829,883	73,829,883
	2,271,997,405	4,237,195,633

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2014 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා

7.2 ණය සහ අත්තිකාරම්	2014	2013
අත්තිකාරම්	රු.	රු.
පරිපාලන නිලධාරී	-	2,000
අත්තිකාරම් - වල්පිට	-	22,600
අම්පාර කලාපය	50,500	191,707
අම්පාර කලාපය - සුළු මුදල්	30,077	77
අනුරාධපුර කලාපය	261,549	200,000
විගණකාධිපති	-	1,400,000
සමූපකාර තොග වෙළඳ සංස්ථාව	-	3,000,000
කොමසාරිස් ගොවිජන සේවා - කුරුණෑගල	274,271	1,600,000
කොමසාරිස් ගොවිජන සේවා - අම්පාර	-	1,200,000
සමූපකාර කොමසාරිස්	9,000,000	9,000,000
කොන්ත්‍රාත්තු දීමනා	1,500	500
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) - වී අලෙවි මණ්ඩලය	20,000	-
නැගෙනහිර කලාපය	244,274	-
උත්සව අත්තිකාරම් ගිණුම	289,200	259,000
රජයේ නියෝජිත - අම්පාර	200,000	200,000
ජී.එල්.ටී.ඩී. කුලතුංග	16,542	-
අභ්‍යන්තර විගණක - වී අලෙවි මණ්ඩලය	40,000	-
ලංකා සතොස (පුද්) සමාගම	1,000,000	1,000,000
පීරිස් මහතා (රජයේ විගණක)	20,000	20,000
එන්. ඒකනායක	825,000	675,000
වයඹ කලාපය	10,549	549
උතුරු කලාපය	94,000	-
පී.ඒ.වී. ධම්මික	11,000	-
පොළොන්නරුව කලාපය	653,500	121,500
ආර්.පී.එම්. පද්ධතිය "බී"	-	795,578
රන්දෙනි	-	89,000
මාර්ග සංවර්ධන අධිකාරිය	797,161	2,421,271
රුවන්තිකා	-	71,628
රාජ්‍ය විවිධ නීතිගත සංස්ථාව	5,450,000	3,000,000
දකුණු කලාපය	535,450	-
සුළු මුදල්		
- ත්‍රිකුණාමලය	51,305	21,305
- පොළොන්නරුව	5,842	-
- අනුරාධපුරය	30,000	-
- ප්‍රධාන කාර්යාලය	21,744	-
- වයඹ	30,000	-
- උතුරු	30,000	-
ණය		
බයිසිකල් ණය	3,725,112	5,032,682
ආපදා ණය	4,122,821	3,174,260
	27,841,397	33,498,658

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2014 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා

7.3 වෙනත් ලැබිය යුතු මුදල්	2014 රු.	2013 රු.
සංවර්ධන නිලධාරී වැටුප් ප්‍රතිපූර්ණ ගිණුම	2,042,030	1,263,930
WHT ලැබිය යුතු මුදල්	2,682,686	2,682,686
සේ.හා.අ. අධිභාරය	9,426	9,426
ණයගැතියන්		
- ලංකා බැංකුව වයඹ	172,880	172,880
- ලංකා බැංකුව උතුර	4,400	60,225
- ලංකා බැංකුව පොලොන්නරුව	470	54,770
- ලංකා බැංකුව අම්පාර	2,788,030	2,788,030
- ලංකා බැංකුව අනුරාධපුර	477,897	478,697
- මහජන බැංකුව	1,691,330	1,691,330
ණයගැතියන්		
- ජී.එම්.ජ්. මැණිකේ	37,000	37,000
	9,906,148	9,238,973

7.4 ඇප හා තැන්පතු	2014 රු.	2013 රු.
නිවාස ඇප තැන්පතු	20,000	20,000
	20,000	20,000

8. මුදල් හා මුදල් සමානතා	2014 රු.	2013 රු.
වාසිදායක මුදල් හා කෙටිකාලීන තැන්පතු		
මුදල් හා බැංකු ශේෂ	27,753,461	187,598,490
	27,753,461	187,598,490

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2014 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා

9. ප්‍රාග්ධනය හා සංචිත

දායක වූ ප්‍රාග්ධනය	2014 රු.	2013 රු.
දායක වූ ප්‍රාග්ධනය	631,484,518	631,484,518
	631,484,518	631,484,518

10.පොළී දරන ණය හා ණය ගැණුම්

	2014			2013		
	ජංගම නොවන රු.	ජංගම රු.	එකතුව රු.	ජංගම නොවන රු.	ජංගම රු.	එකතුව රු.
බැංකු ණය (10.1)	-	6,444,719,871	6,444,719,871	-	8,326,971,903	8,326,971,903
බැංකු අයිරා	-	288,073,415	288,073,415	-	209,044,109	209,044,109
	-	6,732,793,286	6,732,793,286	-	8,536,016,012	8,536,016,012

10.1 බැංකු ණය	පොළී අනුපාතය	2014.01.01 දිනට රු.	ලබාගත් ණය රු.	ආපසු ගෙවීම් රු.	උපචිත පොළිය රු.	2014.12.31 දිනට රු.
ලංකා බැංකුව		4,115,894,129	-	986,113,036	-	3,129,781,093
ජාතික ඉතිරි කිරීමේ බැංකුව		1,142,958,904	-	142,958,904	-	1,000,000,000
මහජන බැංකුව		2,651,992,611	-	337,053,833	-	2,314,938,778
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව		416,126,259	-	416,126,259	-	-
		8,326,971,903	-	1,882,252,032	-	6,444,719,871

11. නිර්වචිත ප්‍රතිලාභ වගකීම්	2014 රු.	2013 රු.
වසර ආරම්භයේ ශේෂය	1,427,735	986,174
වසර සඳහා ප්‍රතිපාදන	495,156	338,722
වර්ෂය සඳහා පොළිය	164,190	113,410
ආයුගණක අලාභය	(45,341)	(10,572)
වසර තුළ සිදුකරන ලද ගෙවීම්		-
වර්ෂය අවසානයේ ශේෂය	2,041,740	1,427,735

12. විලම්භිත ආදායම්	2014 රු.	2013 රු.
වසර ආරම්භයේ ශේෂය	192,000,000	112,000,000
වසර තුළ ප්‍රාග්ධන වියදම් සඳහා රාජ්‍ය ප්‍රදාන	175,000,000	80,000,000
ආදායම් ප්‍රකාශය සඳහා ගාස්තු	-	-
වර්ෂය අවසානයේ ශේෂය	367,000,000	192,000,000

වැඩිදියුණු කිරීම්, ගබඩා ඉදිකිරීම හා පරිගණකගත කිරීම් සඳහා සමාගමට ලබා දෙන ලද රාජ්‍ය ප්‍රදාන මෙමගින් නියෝජනය කෙරේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2014 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා

13. **වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල්**	**2014** රු.	**2013** රු.
වෙළඳ ගෙවිය යුතු මුදල් (13.1)	248,160,892	557,077,734
විවිධ ණයහිමියන් (13.2)	2,287,001,461	2,739,395,226
වෙනත් ගෙවිය යුතු මුදල් (13.3)	455,788,429	390,125,090
උපචිත වියදම්	24,503,686	66,062,980
	3,015,454,467	3,752,661,030

13.1 **වෙළඳ ගෙවිය යුතු මුදල්**	**2014** රු.	**2013** රු.
ලංකා සතොස ණය	200,000,000	200,000,000
අපනයන සඳහා සහල් මෝල් හිමියන්	8,160,892	67,077,734
රජයේ ඒජන්තවරයාට ගෙවිය යුතු මුදල්		
- අම්පාර	10,000,000	10,000,000
- හම්බන්තොට	-	250,000,000
- ත්‍රිකුණාමලය	30,000,000	30,000,000
	248,160,892	557,077,734

13.2 **විවිධ ණයහිමියන්**	**2014** රු.	**2013** රු.
සමූපකාර සංවර්ධන අරමුදල	-	454,000,000
මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු මුදල්	2,250,000,000	2,250,000,000
විවිධ ණයහිමියන්	37,001,461	35,395,226
	2,287,001,461	2,739,395,226

13.3 **වෙනත් ගෙවීම්**	**2014** රු.	**2013** රු.
වෙන්කිරීම් (13.3.1)	452,838,142	387,218,311
ගෙවිය යුතු තැන්පතු (13.3.2)	1,241,475	1,216,475
හිමිකම් නොපෑ වැටුප්	38,031	38,031
සේ.අ.අ. ගෙවිය යුතු ගිණුම	11,076	4,584
සේ.භා.අ. ගෙවිය යුතු ගිණුම	1,573	599
බැංකු දෝෂ	308,885	308,885
එස්.ජී. ජේම්ස් මහතාට ගෙවිය යුතු මුදල්	116	116
C.T.C. හාල් මෝලට ගෙවිය යුතු මුදල්	1,338,089	1,338,089
වැටුප් පාලන ගිණුම	11,040	-
	455,788,429	390,125,090

13.3.1 **වෙන් කිරීම්**	**2014** රු.	**2013** රු.
වියළි බර සඳහා වෙන්කිරීම්	433,473,589	362,507,096
ණය පොළී ගාස්තු සඳහා වෙන්කිරීම්	-	5,356,046
පිරිවැටුම් බදු සඳහා වෙන් කිරීම්	19,355,269	19,355,269
වැටුප් අවකරණ	9,284	(100)
	452,838,142	387,218,311

13.3.2 **ආපසු ගෙවිය යුතු තැන්පතු**	**2014** රු.	**2013** රු.
M.M. ආපසු ගෙවිය යුතු තැන්පතු	372,925	372,925
වෙනත් තැන්පතු - ආපසු ගෙවිය යුතු කුලී තැන්පතු	250,000	250,000
ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු	378,550	353,550
ආරක්ෂක තැන්පතු	240,000	240,000
	1,241,475	1,216,475

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2014 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා

14.	**ආදායම**	**2014**	**2013**
		රු.	රු.
	ආදායම	1,554,507,661	7,878,868,461
	එකතුව	1,554,507,661	7,878,868,461

15.	**වෙනත් ආදායම්**	**2014**	**2013**
		රු.	රු.
	ආපදා ණය පොළිය	147,325	129,237
	ස්ථාවර තැන්පතු පොළී ආදායම	23,222,464	33,905,971
	රක්ෂණ හිමිකම් ඉල්ලීම්	241,862	-
	ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් ආදායම	-	4,500
	වෙනත් ආදායම්	20,560	1,490,921
	පොලිසැක් බෑග් විකුණුම්	-	969,781
	වී මෝල් ලියාපදිංචි කිරීමෙන් ලද ආදායම	4,000	-
	කුලී ආදායම	3,101,400	3,773,600
	ඉතිරි කිරීම් ගිණුම් පොළී ආදායම	359,127	199,814
	ටෙන්ඩර් තැන්පතු ආදායම	8,000	1,500
	මහා භාණ්ඩාගාර ප්‍රදාන	66,500,000	40,000,000
	වී මෝල් ගාස්තු සඳහා වැඩිපුර ප්‍රතිපාදන	-	33,885,240
		93,604,738	114,360,563

16.	**මූල්‍ය වියදම්**	**2014**	**2013**
		රු.	රු.
	බැංකු අයිරා ගාස්තු	481,774	35,318,805
	සමුපකාර සංවර්ධන අරමුදලේ ණය පොළිය	53,898,893	-
	ගොවි භාරකාර අරමුදල ණය පොළිය	-	2,612,669
	බැංකු පොළිය - ලංකා බැංකුව	378,524,779	434,409,529
	බැංකු පොළිය - ජාතික ඉතිරි කිරීමේ බැංකුව	148,786,903	169,750,056
	බැංකු පොළිය - මහජන බැංකුව	274,007,586	255,654,187
	බැංකු පොළිය - ග්‍රාමීය සංවර්ධන බැංකුව	20,942,741	53,008,524
	ණය වියදම්	-	1,065,000
		876,642,675	951,818,770

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2014 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා

17. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇති මුදල් සහ කෙටිකාලීන තැන්පතු

මුදල් හා කෙටිකාලීන තැන්පතුවල සංරචක	**2014** රු.	**2013** රු.
17.1 වාසිදායක මුදල් හා කෙටිකාලීන තැන්පතු		
මුදල් සහ බැංකු ශේෂ	27,753,461	187,598,490
	27,753,461	187,598,490
17.2 වාසිදායක නොවන මුදල් සහ කෙටිකාලීන තැන්පතු		
බැංකු අයිරා	(288,073,415)	(209,044,109)
මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණු සඳහා මුළු මුදල් සහ කෙටිකාලීන තැන්පතු	(260,319,954)	(21,445,619)

18. වගකීම් සහ හදිසි අවශ්‍යතා

-

19. ඇප තැබූ වත්කම්

වගකීම් සඳහා ඇපතැබූ වත්කම් නොමැත

20. ශේෂ පත්‍ර දිනයෙන් පසුව සිදු වූ සිදුවීම්

ගැළපීම් සිදුකිරීම අවශ්‍ය වන හෝ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතු වැදගත් සිදුවීම් කිසිවක් ශේෂපත්‍ර දිනෙන් පසු සිදු වී නොමැත.

විස්තීර්ණ ආදායම් පිළිබඳ සවිස්තරාත්මක ප්‍රකාශය
2014 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා

		2014.12.31 දිනෙන් අවසන් වසර රු.	2013.12.31 දිනෙන් අවසන් වසර රු.
ආදායම	I	1,554,507,661	7,878,868,461
විකුණුම් පිරිවැය	II	(1,791,525,409)	(8,000,846,106)
දළ ලාභය		(237,017,748)	(121,977,645)
එකතු කළා: වෙනත් ආදායම්	III	93,604,738	114,360,563
අඩුකළා: වියදම්			
පරිපාලන වියදම්	IV	(103,638,540)	(71,785,055)
විකුණුම් හා බෙදාහැරීමේ වියදම්	V	(2,744,206)	(4,626,631)
මූල්‍ය හා වෙනත් වියදම්	VI	(877,181,351)	(952,209,770)
		(1,126,977,106)	(1,036,238,538)

I ප්‍රකාශය	**2014** රු.	**2013** රු.
ආදායම		
	1,524,308,523	7,678,510,540
විකුණුම් - වී	4,444,200	16,450,000
- වී (මඩ)	805,000	21,050,000
- සුනු සහල්	24,949,938	12,419,329
- සහල්	-	70,795,292
සුන් සහල් විකිණීම් (අපනයන වැඩසටහනට අදාළව)	-	79,643,299
සහල් විකිණුම්		
(අපනයන වැඩසටහනින් ලංකා සතොසට වී විකිණීම)	-	-
සහල් අපනයන	1,554,507,661	7,878,868,461

II ප්‍රකාශය	**2014** රු.	**2013** රු.
විකුණුම් පිරිවැය		
විකුණුම් පිරිවැය - වී	1,679,519,857	7,664,022,049
වී මිලදී ගැනීම මත සෘජු පොදු කාර්ය වියදම්	109,908,524	334,454,779
වී නිකුත් කිරීම මත සෘජු පොදු කාර්ය වියදම්	2,058,330	811,245
වී අපනයනය කිරීම මත සෘජු පොදු කාර්ය වියදම්	38,698	1,558,033
	1,791,525,409	8,000,846,106
විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	3,896,406,649	3,805,164,175
වී මිලදී ගැනීම්	148,662,971	7,755,264,523
(-) අවසාන තොගය	(2,365,549,763)	(3,896,406,649)
	1,679,519,857	7,664,022,049

විස්තීර්ණ ආදායම් පිළිබඳ සවිස්තරාත්මක ප්‍රකාශය
2014 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා

සෘජු පොදු කාර්ය වියදම්

වී මිලදී ගැනීම් මත සෘජු පොදු කාර්ය වියදම්

දැන්වීම් වියදම්	222,612	8,600,392
පරිපාලන දීමනා	53,000	-
බැංකු ගාස්තු	-	12,449
කොමිස් මුදල් සහ ප්‍රවාහණ	-	978,100
පාරිභෝගික අයිතම - ගබඩා	60,447	1,994,938
වී මිලදී ගැනීමේ සෘජු වියදම්	-	2,760
වියළි බර - වී තොග	70,966,493	65,200,777
ඉන්ධන ගාස්තු	104,998	153,400
ධූමකරණ ගාස්තු	58,484	-
කම්කරු පිරිවැය	1,291,272	7,111,915
තෙතමාපක සහ තරාදි අලුත්වැඩියාව	763,992	1,181,044
නාට්ටාමි ගාස්තු	1,913,638	43,007,681
වෙනත් වියදම්	-	493,122
වී රක්ෂණ ගාස්තු	-	2,707,684
වී ගබඩා නඩත්තු ගාස්තු	248,353	1,201,754
වී තොග සත්‍යාපන වියදම්	3,116,453	1,172,931
පොලිසැක් බෑග් වියදම්	23,034,816	150,707,466
මුද්‍රණ කටයුතු සහ ලිපිද්‍රව්‍ය	50,325	299,782
අළුත්වැඩියාව සහ නඩත්තුව - ගබඩා	-	55,030
ඇප ගාස්තු - ගබඩා	1,051,250	2,280,183
ගබඩා කුලී වියදම්	235,000	152,000
ගබඩා නඩත්තු වියදම්	2,290,555	961,754
ප්‍රවාහණ ගාස්තු	4,446,837	46,164,518
බර කිරීමේ ගාස්තු	-	15,100
	109,908,524	334,454,779

වී නිකුත් කිරීම මත සෘජු පොදු කාර්ය

පාරිභෝජ්‍ය අයිතම	3,578	-
කම්කරු ගාස්තු	1,452,850	85,350
නාට්ටාමි ගාස්තු	282,082	58,630
වී නිකුත් කිරීමේ වියදම්	262,656	662,910
මුද්‍රණ කටයුතු සහ ලිපිද්‍රව්‍ය	1,299	-
මුද්දර ගාස්තු	100	-
වෙනත් වියදම්	2,215	4,355
ප්‍රවාහණ ගාස්තු	53,550	-
	2,058,330	811,245

හාල් විකිණුම් මත සෘජු පොදු කාර්ය

හාල් අපනයන සඳහා නාට්ටාමි ගාස්තු	31,548	640,602
හාල් අපනයන සඳහා කම්කරු ගාස්තු	7,150	50,240
හාල් අපනයන සඳහා පාරිභෝජ්‍ය අයිතම	-	5,160
හාල් අපනයන සඳහා මුද්‍රණ ගාස්තු	-	555
හාල් අපනයන සඳහා වෙනත් වියදම්	-	15,110
ධූමකරණ ගාස්තු	-	846,366
	38,698	1,558,033

විස්තීර්ණ ආදායම් පිළිබඳ සවිස්තරාත්මක ප්‍රකාශය
2014 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා

III ප්‍රකාශය	**2014** රු.	**2013** රු.
වෙනත් ආදායම්		
ආපදා ණය පොළිය	147,325	129,237
ස්ථාවර තැන්පතු පොළි ආදායම	23,222,464	33,905,971
රක්ෂණ හිමිකම් ඉල්ලීම්	241,862	-
ඉතිරි කිරීම් ගිණුම් පොළී ආදායම	-	4,500
ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් ආදායම	20,560	1,490,921
ටෙන්ඩර් තැන්පතු ආදායම	-	969,781
පොලිසැක් බෑග් විකුණුම්	4,000	-
කුලී ආදායම	3,101,400	3,773,600
ගබඩා බදු ආදායම්	359,127	199,814
මහා භාණ්ඩාගාර ප්‍රදාන	8,000	1,500
වෙනත් ආදායම්	66,500,000	40,000,000
වී මෝල් ගාස්තු සඳහා වැඩිපුර ප්‍රතිපාදන	-	33,885,240
	93,604,738	114,360,563

IV ප්‍රකාශය	**2014** රු.	**2013** රු.
පරිපාලන වියදම්		
ගිණුම්කරණ සහ වෘත්තීය ගාස්තු	-	100,000
විගණන ගාස්තු	75,000	75,000
විගණන සහ කළමනාකරණ කමිටු සාමාජික ගාස්තු	30,000	-
නවාතැන් ගාස්තු	534,398	17,000
බැංකු ගාස්තු	66,385	182,966
පොත් සහ වාර සඟරා	-	2,390
ගොඩනැගිලි සහ නිවාස කුලී වියදම්	5,850	29,250
අනියම් කම්කරු ගාස්තු	-	543,900
සභාපති දීමනාව	720,000	720,000
චෙක් පොත් ගාස්තු	-	12,750
වන්දි වියදම්	50,000	-
උපදේශන ගාස්තු	284,500	117,500
පාරිභෝජ්‍ය අයිතම	345,889	132,196
ජීවන වියදම	16,314,060	9,221,520
හර බදු	-	0
ක්ෂය කිරීම්	14,000,559	9,661,889
අධ්‍යක්ෂ ගාස්තු	288,000	222,000
පරිත්‍යාග	-	151,000
විදුලිබල වියදම්	1,096,721	998,626
සේ.අ.අ. වියදම්	6,688,592	4,207,366
සේ.භා.අ. වියදම්	1,672,148	1,051,842
ඉන්ධන ගාස්තු	1,742,037	2,596,684
පාරිතෝෂික වියදම	495,156	338,722
හෝටල් සහ නවාතැන් ගාස්තු	-	126,776
දිරිදීමනා සහ අනියම් වේතන	-	199,055
පාරිතෝෂිකය මත පොළිය	164,190	113,410
පිරිසිදු කිරීමේ වියදම	863,500	772,200
කම්කරු ගාස්තු	485,710	353,282
නීති වියදම්	306,250	74,191
වෛද්‍ය වාර්තා ගාස්තු	4,500	500
නගර සභා බදු	-	486,595
පුවත්පත්	91,450	76,045

විස්තීර්ණ ආදායම් පිළිබඳ සවිස්තරාත්මක ප්‍රකාශය
2014 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා

වෙනත් දීමනා	8,589,965	5,197,503
වෙනත් වියදම්	624,386	254,342
අතිකාල	1,528,568	1,565,908
විශ්‍රාම වැටුප් අරමුදල් වියදම්	198,550	69,245
තැපැල් වියදම්	126,851	107,914
මුද්‍රණය සහ ලිපිද්‍රව්‍ය	2,521,970	1,437,803
වෘත්තීය ගාස්තු	38,000	-
සුළු කෑම සහ බීම ගාස්තු	375,174	484,676
අළුත්වැඩියාව සහ නඩත්තුව	655,663	402,306
කුලී, වරිපනම් සහ බදු	124,503	-
වැටුප්	34,188,633	22,855,583
ආරක්ෂක ගාස්තු	2,432,143	1,974,744
කාර්ය මණ්ඩල පුහුණු වියදම් සහ ඒ හා අදාළ වෙනත් වියදම්	731,317	499,972
කාර්ය මණ්ඩල සුබසාධන වියදම්	291,718	178,188
මිණුම් ගාස්තු	168,360	32,157
දුරකථන වියදම්	1,311,173	876,181
පරිවර්තන ගාස්තු	32,288	6,068
ප්‍රවාහන ගාස්තු	223,740	439,240
වාහන හා වෙනත් උපාංග ආදායම් බලපත්‍ර	44,380	68,885
වාහන රක්ෂණය	225,664	284,502
වාහන නඩත්තු කිරීම	2,250,295	1,902,702
ජල වියදම්	630,306	562,482
	103,638,540	71,785,055

V ප්‍රකාශය	2014 රු.	2013 රු.
විකුණුම් හා බෙදාහැරීම් වියදම්		
දැන්වීම් සහ ප්‍රචාරණය	398,462	1,334,478
ප්‍රවාහනය සහ යැපීම් දීමනා	270,277	482,820
වාහන කුලී ගාස්තු	2,075,467	2,809,333
	2,744,206	4,626,631

VI ප්‍රකාශය	2014 රු.	2013 රු.
මූල්‍ය හා වෙනත් වියදම්		
දැයට කිරුළ වියදම්	538,676	391,000
සමූපකාර සංවර්ධන අරමුදලේ ණය පොළිය	53,898,893	-
ගොවි භාර අරමුදලේ ණය පොළිය	-	2,612,669
ණය වියදම්	-	1,065,000
ණය පොළිය - ලංකා බැංකුව	378,524,779	434,409,529
ණය පොළිය - ජාතික ඉතිරි කිරීමේ බැංකුව	148,786,903	169,750,056
ණය පොළිය - මහජන බැංකුව	274,007,586	255,654,187
ණය පොළිය - ග්‍රාමීය සංවර්ධන බැංකුව	20,942,741	53,008,524
බැංකු අයිරා ගාස්තු	481,774	35,318,805
	877,181,351	952,209,770

විගණකාධිපති වාර්තාව - 2014

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ටීසීඑම්/ඩී/පීඑමබී/1/14

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2017 ඔක්තෝබර් 31 දින

02 NOV 2017

සභාපති,

ටී අලෙවි මණ්ඩලය.

ටී අලෙවි මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ටී අලෙවි මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1971 අංක 14 දරන ටී අලෙවි මණ්ඩල පනතේ 30 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාව මණ්ඩලයේ සභාපති වෙත 2017 අගෝස්තු 23 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය ව්‍යාචනය

මෙම වාර්තාවේ 2.2ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

මණ්ඩලය නිරන්තරයෙන් මිලදීගෙන තිබූ වී තොග වෙළඳපොළ මිලට හා පිරිවැයට වඩා අඩු මිලකට විකිණීම හේතුවෙන් ඊළඟ කන්නයේ වී මිලදීගැනීම සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීම හා අලෙවියෙන් වූ පාඩු පියවා ගැනීමට වාර්ෂිකව භාණ්ඩාගාරයෙන් සහ රාජ්‍ය බැංකු වෙතින් ණය ලබා ගැනීමට කටයුතු කර තිබුණි. 2009 වසරේ සිට 2014 වසර දක්වා වී මිලදී ගැනීම හා මෙහෙයුම් වියදම් සඳහා රජයේ බැංකු 03 කින් ලබාගෙන තිබුණු ණය හා අත්තිකාරම් මුදලින්

2017 ජූනි 20 දින වන විට රු. මිලියන 18,645.3 ක් හා ඒ සඳහා ගෙවිය යුතු පොලිය රු. මිලියන 420.8 ක් වී තිබුණි. මේ හේතුවෙන් රජයේ හෝ වෙනත් මූල්‍ය අනුග්‍රහයකින් තොරව මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම සඳහා පවත්නා අවදානමට බලපෑමක් නොවේය යන්න බැහැර කළ නොහැකි විය.

2.2.2 සම්බන්ධිත පාර්ශවයන් සමග ඇති ගනුදෙනු හෙළිදරව් කිරීම

වී අලෙවි මණ්ඩලයේ සභාපතිවරයා, ආරම්භක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කරන "C.W.E.Construction and Engineering (Private) Limited" වෙත ආයතනයේ ඉදිකිරීම් කටයුතු පවරා සමාලෝචිත වර්ෂයේදී රු. 298,889,804 ක් ගෙවීම් කර තිබුණ ද එම ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7

පහත සඳහන් නිරීක්ෂණ හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ තුල්‍යතාවය සම්බන්ධයෙන් විගණනයේ දී ගැටළු සහගත විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දේපළ පිරියත හා උපකරණ වෙනුවෙන් මුදල් ගලා යාම් රු.2,853,054 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ එය රු.26,664,302 ක් ලෙස දක්වා තිබීම.

(ආ) ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ දක්වා තිබූ පෙර වර්ෂ ගැලපීම් රු.18,520,161 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ලාභයට ගලපා තිබීම.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉදිකිරීම් කටයුතු අවසන් වූ මීතොටමුල්ල ගබඩා සංකීර්ණය ඉදිකිරීම හා වැල්ලවාය ගබඩා නවීකරණය සහ ඉඩමෙහි වැට ඉදිකිරීම් සඳහා ගෙවූ රු. 8,286,422 ක් ඉඩම් හා ගොඩනැගිලි ගිණුමට ප්‍රාග්ධනීත කිරීම වෙනුවට කෙරීගෙන යන වැඩ ගිණුමෙහි ගිණුම්ගත කර තිබුණි.මේ හේතුවෙන් ඉඩම් හා ගොඩනැගිලි ක්ෂය කිරීම්ද රු.207,160 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මිලදීගෙන තිබුණු රු.4,849,303 ක ලී බඩු හා උපකරණ,එම ගිණුමට සටහන් නොකර කෙරීගෙන යන වැඩ ගිණුමට සටහන් කර තිබුණි. මේ හේතුවෙන් ලී බඩු හා උපකරණ ක්ෂය කිරීම්රු.969,860 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් ගෙවීම් කිරීමේදී 2013 හා 2014 වර්ෂයන්හිදී පිළිවෙළින් රු.5,965,656 ක් හා රු.5,540,196 ක් රඳවා ගැනීමේ මුදල් ලෙස අඩු කර ගෙන තිබුණද එය ගිණුම්වල ගැලපීම් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වී තොගයේ වටිනාකම භෞතිකව සත්‍යාපනය නොකර පොත් ශේෂය වූ රු.2,365,549,763 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඉ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ 2012 වර්ෂයේ සිට ඉදිරියට එන රු.54,385,222 ක් වූ මාර්ගස්ථ තොගය, රු.3,302,853 ක් වූ සෝයාබෝංචි තොගය හා රු.84,972 ක් වූ සහල් තොගය භෞතිකව නොපවතින ශේෂයන් වූයෙන් තොග ශේෂය එකතුව රු.57,773,047 ක් වැඩියෙන් දක්වා තිබුණි.

2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

ගිණුම් විෂයය	වටිනාකම රු.	ඉදිරිපත් නොකළ සාක්ෂි
හඳුනා නොගත් වී මිලදී ගැනීම	73,829,883	විස්තරාත්මක තොරතුරු, සනාථ කිරීම
ගැනුම් පාලන ගිණුම	49,743,530	
Rice Millers ණයට විකුණුම්	68,993,349	

2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට රු.2,271,997,405 ක් වූ ණයගැති ශේෂය තුල වසර 5 කට වැඩි රු.60,335,368 ක්,වසර 2 ත් වසර 4 ත් අතර රු.540,850,201ක්, වසර 1 ත් වසර 2 ත් අතර රු.1,454,547,464 ක් හා මාස 6 ට අඩු රු.216,264,372 ක ශේෂ ඇතුළත් වූ අතර එම ශේෂ නිරවුල් කර ගැනීමට 2017 ජුනි 30 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ උපදෙස් ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී මණ්ඩලය විසින් සහල් අපනයනය සඳහා රු. මිලියන 469.34 ක් වටිනා නාඩු වී කිලෝග්‍රෑම් 12,019,045 ක් සහල් මෝල් වෙත නිකුත් කර තිබුණි. වී නිකුත් කිරීමට අදාලව අමාත්‍යාංශය නමින් විකුණුම් ඉන්වොයිසි පිළියෙල කර නොතිබුණු අතර මෙම වී වෙනුවෙන් අමාත්‍යාංශයෙන් ලැබී තිබුණේ රු. මිලියන 169.46 ක මුදලක් පමණි. ඒ අනුව අපනයනය සඳහා වී සැපයීම වෙනුවෙන් අමාත්‍යාංශයෙන් මණ්ඩලයට රු. මිලියන 299.88 ක් ලැබිය යුතුව පැවතුණි.

(ඇ) 2014 පෙබරවාරි 06 දිනැති අංක DFD/Agri/RiceExp දරන සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ ලිපිය ප්‍රකාරව ලෝක ආහාර වැඩසටහන යටතේ සහල් ප්‍රදානය කිරීම සඳහා මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී අම්පාර හා හම්බන්තොට දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත වටිනාකමරු.මිලියන 216.26 ක් වූ නාඩු වී කිලෝග්‍රෑම් 5,028,063 ක් හා සම්බා වී කිලෝග්‍රෑම් 468,726 ක් නිකුත් කර තිබුණු අතර එම මුදල 2017 ජූලි 31 දින වන විටත් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වෙතින් ලබාගෙන නොතිබුණි.

2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම්
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 188(2)	2012 වර්ෂයේ සිට පැවත එන රු.233,300 ක් වූ උපලබ්ධි නොවූ තැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි395 (ඇ)	මණ්ඩලයේ බැංකු ගිණුම් 08 ක 2016 දෙසැම්බර් මාසය සඳහා වූ බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ ප්‍රමාදය මාස 06 ක් වූ අතර බැංකු ගිණුමක බැංකු සැසඳුම් ප්‍රකාශ 2015 මාර්තු මාසයේ සිට පිළියෙල කර නොතිබුණි.
(ආ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය	
(i) 5.4.4 ඡේදය	අත්තිකාරම් ඇපකරයක් තබාගෙන කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් සියයට 20 ක උපරිමයක් දක්වා වැඩ පූර්ව අත්තිකාරම් ලබාදිය හැකි වුවත් සමාලෝචිත වර්ෂයේදී සිදුකළ ඉදිකිරීම් කොන්ත්‍රාත් 14 ක් සඳහා මණ්ඩලය විසින් කිසිදු අත්තිකාරම් ඇපකරයක් තබා ගැනීමකින් තොරව කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 30 ක් දක්වා එනම් රු.49,754,113 ක අත්තිකාරම් ලබාදී තිබුණි.

(ii) 5.4.8 ඡේදය	අදාළ කොන්ත්‍රාත්කරුවන් විසින් කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් සියයට 5 ක කාර්යසාධන ඇපකරයක් ඉදිරිපත් කළ යුතු වුවත් මණ්ඩලය විසින් ඉහත (i) හි සඳහන් කොන්ත්‍රාත් සම්බන්ධයෙන් කාර්යසාධන ඇපකර ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් අලාභය රු.1,126,931,765 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අලාභය රු.1,036,227,966 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අලාභයෙහි වැඩිවීම රු.90,703,799 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව දළ අලාභය රු.115,040,103 කින් වැඩිවීම ඉහත අලාභය වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ තුනක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය සියයට 857 කින් පිරිහී තිබුණි. 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ සියයට 48 කින් මූල්‍ය ප්‍රතිඵලය වර්ධනය වී තිබුණු අතර 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ සියයට 9 කින් මූල්‍යප්‍රතිඵලය පිරිහී තිබුණි.කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී මණ්ඩලයේ රු.1,003,710,494 ක් වූ සෘණ දායකත්වය 2014 වර්ෂය වනවිට රු.1,078,742,573ක සෘණ දායකත්වයක් දක්වා එනම් සියයට 07 කින් වැඩි වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

මණ්ඩලයේ බැංකු ගිණුම් 04 කට අදාලව 2012 වර්ෂයේ සිට පැවත එන රු.49,177,485 ක් වූ හඳුනා නොගත් තැන්පතු හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

2009 ඔක්තෝබර් 02 දිනැති අංක පීඑම්බී/එම්ඒඑච්ඒ/එස්ඒආර්එෆ්/2008-09 දරන වී අලෙවි මණ්ඩල චක්‍රලේඛය ප්‍රකාරව නියමිත පරිදි බැංකු ගිණුමට මුදල් බැර වී ඇත්දැයි තහවුරු කර ගැනීමෙන් පසුව මුදල් භාරගැනීමේ කුවිතාන්සි නිකුත් කිරීම හා වී විකිණීමේ නිවේදන නිකුත් කිරීම කළ යුතු වුවත්, එම ක්‍රමවේදයන් අනුගමනය නොකිරීම හේතුවෙන් එකම මුදල් තැන්පතු පත්‍රිකාවේ මුල් පිටපතට හා ඡායා පිටපතට මණ්ඩලය විසින් රු.9,600,000 ක් වටිනා වී දෙවරක් නිකුත් කර තිබුණු අවස්ථාවක් නිරීක්ෂණය විය.

4.3 කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති සියළුම ආයතනවලට අයත් ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ සහ නව ඉදිකිරීම් සමූපකාර තොග වෙළඳ සංස්ථාවට අනුබද්ධිත ප්‍රධාන ඉංජිනේරුවරයකු යටතේ ඇති ඉදිකිරීම් අංශයට භාරදෙන ලෙස සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් 2010 සැප්තැම්බර් 06 දින නිකුත් කර තිබූ ලිපියක් පාදක කරගෙන, රු. මිලියන 258.19 ක් වටිනා කොන්ත්‍රාත් 17 ක් සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලින් බැහැරව සමූපකාර තොග වෙළඳ සංස්ථාවට අනුබද්ධිත පෞද්ගලික සමාගමක් වෙත පවරා තිබුණි.
මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මණ්ඩලයේ සභාපති, සමූපකාර තොග වෙළෙඳ සංස්ථාවේ සභාපති හා සමූපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකු ඉහත අනුබද්ධිත සමාගමේ අධ්‍යක්ෂකවරයන් ලෙස පත්කරමින් 2012 මැයි 18 දින මෙම සමාගම සංස්ථා ගත කර තිබුණි.

(ii) ඉහත අනුබද්ධිත සමාගම සතුව ඉදිකිරීම් සම්බන්ධව තාක්ෂණික දැනුම සහිත නිලධාරීන් නොමැතිවීම හේතුවෙන්, එම සමාගම විසින් විනිවිද භාවයෙන් තොරව තෝරාගත් පුද්ගලයන් වෙත ඉහත සඳහන් ඉදිකිරීම් සඳහා උප කොන්ත්‍රාත්තු ලබාදී තිබුණි.

(iii) එම ඉදිකිරීම් සම්බන්ධව සිදුකළ විගණන පරීක්ෂාවේ පහත කරුණු නිරීක්ෂණය විය.

* අක්කරෙයිපත්තුව වී ගබඩාව නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුවේ රු.24,184,502 ක පිරිවැය ඇස්තමේන්තුව සකස් කිරීම කොන්ත්‍රාත්කරුගේ එකඟතාවය මත සිදුවී තිබුණි. තවද ඇස්තමේන්තු ප්‍රමාණ පත්‍රය අනුව සියයට 150 සිට සියයට 276 දක්වා ප්‍රමාණ විචලතාවයක් වෙනුවෙන් රු.1,345,328 ක් සහ අවස්ථා 5 ක දී අමතර වැඩ සඳහා රු.559,880 ක් ගෙවා තිබුණි.

* කඳුරුවෙල වී ගබඩාව නවීකරණය කිරීම සඳහා වූ පිරිවැය රු.23,074,094 ක කොන්ත්‍රාත්තුවේ උපදේශන ගාස්තු ලෙස රු.600,479 ක මුදලක් සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු පෞද්ගලික සමාගමට ගෙවා තිබුණි. කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තු, ප්‍රමාණ පත්‍ර සහ ව්‍යුහගත සැලසුම් සකස් කිරීම සහ කොන්ත්‍රාත්තුව විමර්ෂණය සඳහා මෙකී මුදල් ගෙවා තිබුණත් සකස් කළ ඇස්තමේන්තු සහ ප්‍රමාණ පත්‍ර, කිසිදු සිවිල් ඉංජිනේරුවකු විසින් සහතික කර නොතිබුණි. තවද ඇස්තමේන්තු ප්‍රමාණ පත්‍රය අනුව සියයට 100 සිට සියයට 159 දක්වා වූ ප්‍රමාණ විචලතාවයන් සඳහා රු. 1,337,400 ක් ගෙවා තිබුණි.

(ආ) ඉහත (අ) ඡේදයේ දැක්වූ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු 17 ට අමතරව පිරිවැය ඇස්තමේන්තුව රු.41,140,418 ක් වූ කිලිනොච්චිය වී ගබඩාව ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සමූපකාර තොග වෙළඳ සංස්ථාව හරහා අනුබද්ධිත පෞද්ගලික සමාගම වෙත පවරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ගබඩාව ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ ඇස්තමේන්තු සකස් කිරීමේ දී හඳුනාගත හැකිව තිබුණු කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම, මාර්ග සකස් කිරීම, දැල් වැටවල් ඉදිකිරීම, ජල ටැංකි ඉදිකිරීම සහ ගෙවතු අලංකරණය සඳහා රු. 8,252,330 ක මුදලක් කොන්ත්‍රාත්තුවේ අමතර වැඩ ලෙස හඳුනාගෙන තිබීම නිසා එම ඉදිකිරීම් වෙනුවෙන් වැඩි මිලක් ගෙවීමට සිදුවී තිබුණි.

(ii) මණ්ඩලය මගින් මෙම ඉදිකිරීම් අධීක්ෂණය සහ අනිකුත් කාර්යයන් සඳහා ඉංජිනේරු උපදේශකවරයකු අර්ධ කාලීන පදනම මත යොදවා තිබියදී මෙම කොන්ත්‍රාත්තුවේ උපදේශන සේවා සඳහා සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු පෞද්ගලික සමාගම වෙතද රු.2,088,486 ක මුදලක් ගෙවා තිබුණි. තවද,මෙම කොන්ත්‍රාත්තුවේ මූලික ඇස්තමේන්තු සහ ප්‍රමාණ පත්‍ර (BOQ) කොන්ත්‍රාත්තුව සිදුකළ සමාගම විසින් සකස් කර තිබුණි. එම ඇස්තමේන්තුව පරීක්ෂා කිරීම සඳහා වී අලෙවි මණ්ඩලය මගින් පත්කළ උපදේශක වෙත රු.5,000 ක දීමනාවක් ගෙවා තිබුණ ද කිසිදු පුද්ගලයකු මෙකී ඇස්තමේන්තු සහතික කර නොතිබුණි.

(iii) වැඩ බිමේ ඉතිරි වූ තොග වෙනුවෙන් ගෙවීම් කිරීමට කොන්ත්‍රාත්කරු සමග ගිවිසුම්ගත වී නොතිබියදී සහ කොන්ත්‍රාත්කරු ලබාදෙන තොග ලේඛනය වැඩ බිමට ගෙන ගොස් පරීක්ෂා කිරීමකින් හා කොන්ත්‍රාත්කරු විසින් එම ද්‍රව්‍ය මිලදී ගත් බිල්පත් පරීක්ෂා කිරීමකින් තොරව කොන්ත්‍රාත්කරු මුදල් ඉල්ලීම් කර නොතිබූ අවස්ථා 02 කදී වැඩ බිමේ ඉතිරි වූ ද්‍රව්‍ය වෙනුවෙන් රු. 12,904,400 ක් ගෙවා තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව, මුදල් වර්ෂයක් සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2017 මාර්තු 02 දිනදිය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) වාහන පාලනය	ධාවන සටහන්, ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වා නොගැනීම.
(ආ) කොන්ත්‍රාත් පැවරුම් සහ ක්‍රියාත්මක කිරීම.	ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව කටයුතු කිරීම.
(ඇ) ගබඩා පරිපාලනය	(i) නිසි ප්‍රමිතියකින් යුතුව වී ගබඩා නොකිරීම හා ගබඩාවල ඇති අඩුපාඩු සකස්කර නොගැනීම. (ii) ගබඩා පාලනය සම්බන්ධ උපදෙස් ගබඩා භාර නිලධාරීන්ට ලබා නොදීම.
(ඈ) බැංකු සැසඳුම්	බැංකු සැසඳුම් ප්‍රමාද වී පිළියෙල කිරීම.
(ඉ) වී විකිණීමේ ක්‍රියාවලිය	විකුණුම් ඉන්වොයිසි පිළියෙල නොකිරීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති.

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව